# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2478/42 - 2026 මාර්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2026.03.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**බලශක්ති අමාත්‍යාංශය**

ජාතික විදුලිබල ප්‍රතිපත්තිය

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 4 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ඇතුළත් ජාතික විදුලිබල ප්‍රතිපත්තිය, බලශක්ති අමාත්‍ය පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි වන මම මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි,**
බලශක්ති අමාත්‍ය.

2026 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

# ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල ප්‍රතිපත්තිය

බලශක්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා රජය

2026.03.03

ශ්‍රී ලංකාවේ විදුලිබල සැපයුම් කර්මාන්තයෙහි සංවර්ධනය හා මෙහෙයුම් සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම පිණිස බලශක්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛනයකි.

2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුකූලව 2026. 03. 03 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 1. හැඳින්වීම

ගෝලීය බලශක්ති ක්ෂේත්‍රය තිරසරභාවය අරමුණු කරගනිමින් සහ පුනර්ජනනීය විදුලි භාවිතය, බලශක්ති ගබඩා කිරීම, විදුලිබලය පාදක ප්‍රවාහනය, හරිත හයිඩ්‍රජන් සහ න්‍යෂ්ටික බලශක්තිය යනාදි වූ තාක්ෂණයන් හි නවෝත්පාදනයන් මගින් ප්‍රේරණය වෙමින් පරිවර්තනීය යුගයක් පසුකරමින් සිටියි. වෙනස්වන පරිභෝජක රටා සහ නියාමන රාමු සමඟ, පිවිතුරු බලශක්ති ප්‍රභවයන් වෙත යොමු වීම වේගවත්ව සිදුවෙමින් පවතී. කෙසේවුවද, විදුලි ඉල්ලුම සපුරාලීමේදී පොසිල ඉන්ධන මගින් දිගින් දිගටම සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින් පවතින පසුබිමක, මෙරට අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් බාධාවකින් තොර විදුලිබල සැපයුමක් පවත්වා ගැනීමට නම් උපායමාර්ගික බලශක්ති මිශ්‍රණයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය ය. අවම විදුලි පිරිවැය තරඟකාරී ආර්ථිකයක් පවත්වාගැනීම සඳහා ද සමස්ත සංවර්ධනයක් ළඟාකරගැනීම උදෙසා ද අත්‍යවශ්‍ය ය.

මෙම ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීම සිදුවන්නේ (2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත) 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් හඳුන්වා දෙනු ලැබූ විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කෙරෙන අතිශය වැදගත් සන්ධිස්ථානයකදී ය. ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය නවීන තාක්ෂණයන්ගෙන් සමන්විත තරඟකාරී සහ විනිවිදභාවයෙන් යුතු කර්මාන්තයක් බවට පරිවර්තනය කිරීමේ උපාය මාර්ග මෙයට ඇතුළත් කර ඇත. තරඟකාරිත්වය, මනා පාලනය, වගවීම සහ ඉහළ මට්ටමේ විනිවිදභාවය තුළින් විදුලිබල පිරිවැය අවම කිරීම ද, එමගින් ශ්‍රී ලංකාව තිරසර අයුරින් සමාජ ආර්ථික ප්‍රගතියක් කරා ගෙන යාම ද මෙහි අරමුණ වී ඇත.

2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාරව, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මගින් එම පනතේ පරමාර්ථ සහ 2019 අගෝස්තු 9 දිනැති අංක 2135/61 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග, සහ ඊට පසුව එක් කරන ලද සංශෝධන සහ යාවත්කාලීන කිරීම් පිළිඹිබු කරනු ලබයි.

2019 අගෝස්තු 9 වන දිනැති අංක 2135/61 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග - 2019 එහි පූර්විකාවේ සඳහන් වන ආකාරයට *“ශ්‍රී ලංකාව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග (2008) ප්‍රකාශනයට අනුකූලව පූර්ණ විදුලියනය සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට අදාළ නියමිත ඉලක්ක කිහිපයක් සපුරා ගැනීමට සමත්ව තිබේ. පිවිතුරු, සුරක්ෂිත, තිරසර, විශ්වසනීය සහ ආර්ථික වශයෙන් ශක්‍යතාව සහිත බලශක්ති සැපයුමක් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ සමාජ සාධාරණ සංවර්ධනයක් සඳහා පහසු සහ දැරිය හැකි මිලකට බලශක්ති සේවා ලබා දීම සහතික කිරීම මෙහි ප්‍රකාශිත ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ සහ උපාය මාර්ගවල ප්‍රධාන අරමුණ වේ.”*

2019 වසරේදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානුෂීය සංවර්ධන දර්ශකයේ මධ්‍යම මට්ටමේ පසු වූ බවත්, 2017 වසරේ වාර්ෂික ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් 4,065 ක් ලෙස මධ්‍යම මට්ටමක පැවති බවත් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග - 2019 ප්‍රකාශනය මගින් පෙන්වා දී ඇත.

ඉදිරි දශකය තුළ ඉහළ මධ්‍යම ආදායම් මට්ටමට ළඟා වීමට රජය දරන ප්‍රයත්නය ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ බලශක්තියේ කාර්යභාරය තීව්‍ර කළ බව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග - 2019 මගින් හඳුනාගෙන ඇත. ආර්ථික වර්ධනය වේගවත් කරන අතරතුර අඩු බලශක්ති තීව්‍රතාවයක්[1] පවත්වා ගැනීම ශ්‍රී ලංකාවට එල්ල වී ඇති අභියෝගය බව ද එහි සඳහන්ව ඇත.

ශ්‍රී ලංකාව 100% ක විදුලියනය නැමති වැදගත් සන්ධිස්ථානයකට ළඟා වී ඇති බවත්, ඒ මගින් සියලුම පුරවැසියන්ට නවීන බලශක්ති ප්‍රභවයන් ලබාදීමේ ඉලක්කය සපුරා ඇති බවත් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග - 2019 මගින් තවදුරටත් පෙන්වා දී ඇත.

රටේ ප්‍රාථමික බලශක්ති සංචිතය තුළ පුනර්ජනනීය බලශක්තිය සඳහා හිමිව ඇති සාපේක්ෂව ඉහළ දායකත්වය ක්‍රමයෙන් අඩුවීමට ඉඩ ඇති බව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග - 2019 මගින් පෙන්වා දී ඇත. මීට හේතුව වන්නේ මෙරට සතු ප්‍රධාන ජල විදුලි

1 දළ දේශීය නිෂ්පාදිතයෙන් ශ්‍රී.ලං.රු.මි.1 නිෂ්පාදනය කිරීමට අවශ්‍ය බලශක්ති ප්‍රමාණය.

විභවයෙන් වැඩි කොටසක් මේ වන විටත් ප්‍රයෝජනයට ගෙන තිබීමයි. ගෘහස්ථ බලශක්ති පරිභෝජකය ෆොසිල ඉන්ධන දෙසට නැඹුරු වීමත් සමඟ, සියලු ආකාරයේ බලශක්තීන් සඳහා පවතින වර්ධනය වන ඉල්ලුම සපුරාලීම සඳහා ෆොසිල ඉන්ධන භාවිතය වැඩි වැඩියෙන් සිදු වේ. ජල සම්පත විවිධ අවශ්‍යතා සඳහා දායක වන අතර, පානීය ජලය සහ කෘෂිකාර්මික අවශ්‍යතාවලට පසුව විදුලි උත්පාදනය සඳහා හිමිවන්නේ තුන්වන ප්‍රමුඛතාවයයි. 2019 වසරට පෙර දශක කිහිපය තුළ 55% ක මට්ටමක පවත්වාගෙන ගිය ප්‍රාථමික බලශක්ති සැපයුමෙහි පුනර්ජනනීය බලශක්ති දායකත්වය ආරක්ෂා කර ගැනීමට සහ එය තවදුරටත් ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රබල වෙනසක් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග - 2019 තුළින් අපේක්ෂා කර ඇත. ප්‍රාථමික බලශක්ති සැපයුම විදුලියට පමණක් සීමා නොවන බව ද සඳහන් කළ යුතුය.

ආර්ථිකය බලගැන්වීම සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලබාගන්නා විශ්වසනීය, පිරිවැය-ඵලදායී සහ තරඟකාරී මිල ගණන් යටතේ පවතින බලශක්ති සේවා සැපයීම සහතික කිරීම සඳහාත්, බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ අභියෝගයට මුහුණ දීම සඳහාත් වූ ශ්‍රී ලංකාවේ සැලසුම ඉදිරිපත් කිරීම පිණිස ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග - 2019 සකස් කොට ඇත.

*“ එක්සත් ජාතීන්ගෙ තිරසාර සංවර්ධන අරමුණුවල 7 වන අරමුණ සමඟ ශ්‍රී ලංකාව අනුගත කරමින්, 2020 වසර වන විට සැමට දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සඳහා වන සර්ව වන සාර්ව ප්‍රවේශය සපුරා ගැනීමට මෙම ප්‍රතිපත්තිය දායක වේ” යන්නෙන් ද එහි ප්‍රකාශිතව ඇත.*

ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග - 2019 *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූයේ 2019 වසරේ දී වුවත්, 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් විදුලි අයකුම දැරිය නොහැකි තත්ත්වයට පත්වීමත් සමඟ 14%සිට 15% දක්වා සැලකිය යුතු ප්‍රතිශතයකගේ පහළ ආදායම් ලබන කුටුම්භ සහ කුඩා ව්‍යාපාරවල විදුලි බල සබඳතා විසන්ධි වීමට ලක්ව ඇති බව පෙනී ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ මූලික අර්ථාන්විත පදනම තවදුරටත් සුභවාදීව වලංගු නොවනු ඇත.

2019 වසරේදී ජාතික බලශක්ති ප්‍රතිපත්තිය මඟින් පසු කර ඇති සංඛ්‍යාන තහවුරු කිරීම සහ ඇගයීම සඳහා තක්සේරුවක් සිදු කෙරෙනු ඇති අතර, ප්‍රකාශිත පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු ආකාරයකින් මෙම විදුලි ප්‍රතිපත්තිය සංශෝධනය කෙරෙනු ඇත.

මෙම ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කර ඇත්තේ මෙවැනි පසුබිමක් අභිමුවය. යාවත්කාලීන කරනු ලබන ජාතික විදුලිබල ප්‍රතිපත්තිය දැනට ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ලෙස පවතින ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග - 2019 හි කොටසක් ද වන්නේ ය. (2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත) 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ නියම කර ඇති පරිදි නව ආයතනික ව්‍යුහය යටතේ මෙම ආයතන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව බලපත්‍රලාභීන් සමඟ සාකච්ඡා කොට මෙම ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

මෙම ප්‍රතිපත්තිය මඟින් විදුලිබල පිරිවැයෙහි විශාලතම සංරචකය වන්නේ උත්පාදන පිරිවැය බව හඳුනාගෙන ඇත. විදුලිබල පිරිවැය අඩු කෙරෙන අතරවාරයේ පුනර්ජනනීය බලශක්තිය මඟින් ලබා දෙන දායකත්වය පුළුල් කිරීමට ද ප්‍රතිපත්තිය තුළින් බලාපොරොත්තු වේ. මෙම පිරිවැය අඩු කිරීමේ සහ පුනර්ජනනීය බලශක්ති දායකත්වය ඉහළ නැංවීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට නම් පුනර්ජනනීය බලශක්ති ප්‍රසම්පාදනය තරඟකාරී ලංසු තැබීම් හරහා සිදු කළ යුතු වේ.

විදුලිය උත්පාදනය කිරීම සඳහා ඉහළම පිරිවැයක් දැරීමට සිදුවන්නේ තාප බලාගාර සඳහා වන දැවි තෙල් බලශක්ති ප්‍රභවය සඳහා බව හඳුනා ගෙන ඇති බැවින්, එවැනි බලාගාරවල උත්පාදන පිරිවැය නියාමක විසින් පරීක්ෂා කිරීමට කටයුතු කෙරෙනු ඇත. එවැනි බලාගාර හිමි සමාගම් එසේ දරනු ලබන පිරිවැය සාධාරණ බව තහවුරු කළ යුතුය. පිරිවැය අවම කිරීම සඳහා ඉන්ධන ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීමට උත්සාහයන් ගෙන ඇති බව කෙටි කාලයක් තුළ තහවුරු කිරීමටද, පරිණත පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්, විකල්ප පුනර්ජනනීය තාක්ෂණයන්, නවීන න්‍යෂ්ටික බලශක්ති තාක්ෂණයන්, අන්තර් දේශසීමා සම්බන්ධතා ආදිය ඇතුළත්ව විකල්ප බොහොමයක් සම්බන්ධයෙන් සලකා බැලීමටද නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් ක්‍රියා කළ යුතුය.

නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ විමසා එවැනි විධිවිධාන සලසා ඇති ජල විදුලි බලාගාර වල ධාරිතාවය පුළුල් කිරීමේ හැකියාවන් සහ දැනට පවතින ජලාශ වල ධාරිතාවය පුළුල් කිරීම් සම්බන්ධයෙන් සොයා බැලීමට කටයුතු කළ යුතුය. ඊට අමතරව, විදුලිබල උත්පාදන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ජලය නිකුත් කිරීමේදී ජලාශ ධාරිතාව, ප්‍රශස්ත ලෙස කළමණාකරණය කිරීම සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් අදාළ සියළු පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කොට ගවේශණය සිදු කෙරෙනු ඇත.

2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 4(2) සහ 4(3) වගන්ති ප්‍රකාරව නියාමක, නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ්, බලපත්‍රලාභීන්, පාරිභෝගික සංවිධාන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විමසීමෙන් අනතුරුව සහ පනතේ 4(4) වගන්තිය ප්‍රකාරව ප්‍රමාණවත් පරිදි මහජනතාවගේ පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව, මෙම ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කරනු ලැබ ඇත.

මෙම ප්‍රතිපත්තිය සහ ජාතික අයකුම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ අදාළ නීතිවලට අනුකූලව අර්ථ නිරූපණය කළ යුතුය. මෙම ප්‍රතිපත්තිය සහ ජාතික අයකුම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ අදාළ නීතිවලට අනුකූල වන සහ අනුරූප වන ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය.

## 2. ප්‍රතිපත්ති ප්‍රකාශය

ජාතික විදුලිබල ප්‍රතිපත්තියට මූලික ප්‍රතිපත්ති පහක් (5) සහ සමගාමී ප්‍රතිපත්ති හයක් (6) ඇතුළත් වේ.

### 2.1. මූලික ප්‍රතිපත්ති

1. විදුලි සැපයුමේ සුරක්ෂිතභාවය සහ ස්වාධීනත්වය ඉහළ නැංවිය යුතුය.
2. විදුලි සේවා සඳහා ආරක්ෂිත සහ සමාජ සාධාරණ ප්‍රවේශය සහතික කළ යුතුය.
3. ජාතික ආර්ථිකය වෙත ප්‍රශස්ත පිරිවැයක් යටතේ විදුලි සේවා සැපයිය යුතුය.
4. විදුලි සේවා ලබාගැනීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් ස්වාධීනත්වය ඉහළ නැංවිය යුතුය.
5. විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනවල දිගුකාලීන මූල්‍ය තිරසරභාවය සහතික කළ යුතුය.

### 2.2. සමගාමී ප්‍රතිපත්ති

I. බලශක්ති කාර්යක්ෂමතාවය සහ විදුලිය සංරක්ෂණය ප්‍රවර්ධනය කළ යුතුය.
II. පුනර්ජනනීය බලශක්තිය පාදක විදුලි උත්පාදනයේ දායකත්වය ඉහළ නැංවිය යුතුය.
III. විදුලිබල ක්ෂේත්‍රයේ උපයෝගිතා ආයතනවල යහපාලනය සහ වගවීම ශක්තිමත් කළ යුතුය.
IV. විදුලි බෙදාහැරීම් පද්ධති සහ පාරිභෝගික සේවා ඩිජිටල්කරණය කඩිනම් කළ යුතුය.
V. ජාතික පරිසර සහ දේශගුණික ප්‍රතිපත්ති පිළිගත යුතුය.
VI. අනාගත විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් සුරක්ෂිත කළ යුතු අතර අනුමැතිය ලබාගැනීමේ සහ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලීන් විධිමත් කළ යුතුය.

## 3. ප්‍රතිපත්ති පිළිබඳ විස්තර

### 3.1. මූලික ප්‍රතිපත්ති පිළිබඳ විස්තර

**1. විදුලිබල සැපයුමේ සුරක්ෂිතභාවය සහ ස්වාධීනත්වය ඉහළ නැංවිය යුතුය.**

මෙරට විදුලිබල සැපයුමේ අඛණ්ඩතාව, ප්‍රමාණවත් බව, ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය සහතික කළ යුතුය. සැපයුම නොකඩවා ලබාදීම සහතික කිරීම සඳහා, විදුලිබල සැපයුම ඕනෑම මූල්‍ය හා භූ-දේශපාලනික අස්ථාවරත්වයන්ට හෝ තාක්ෂණික වෙනස්වීමකට ඔරොත්තු දීමට තරම් ස්වාධීනත්වයකින් යුක්ත විය යුතුය.

**2. විදුලි සේවා සඳහා ආරක්ෂිත සහ සමාජ සාධාරණ ප්‍රවේශය සහතික කළ යුතුය.**

සිය ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා මෙන්ම ලාභ ලබන ආර්ථික කටයුතුවලට යොමුවීම දිරිගැන්වීම සඳහා සියලුම පුරවැසියන් වෙත විශ්වසනීය, පහසු, මිල දැරිය හැකි, සුරක්ෂිත සහ ගුණාත්මක විදුලි සේවා සඳහා සමාන ප්‍රවේශයක් ඇති කෙරෙනු ඇත.

**3. ජාතික ආර්ථිකය වෙත ප්‍රශස්ත පිරිවැයක් යටතේ විදුලි සේවා සැපයිය යුතුය.**

ජාතික ආර්ථිකය මත එල්ල වන වැය බර අඩු කිරීම සඳහාත් ආර්ථිකයේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහාත් ප්‍රශස්ත දිගුකාලීන පිරිවැයක් යටතේ විදුලි සේවා සැපයීමට කටයුතු කෙරෙනු ඇත. අනාගත විදුලි උත්පාදනයන් සහ බෙදාහැරීමේ ධාරිතා එක් කිරීම් සම්බන්ධව නැෂනල් සිස්ටම් ඔපරේටර් ප්‍රයිවට් ලිමිටඩ් විසින් තීරණය කරනු ලබන අතර එය අවම පිරිවැය පාදක කරගත් ප්‍රශස්ත සැලසුම් මූලධර්ම මත පදනම්ව සිදු කෙරෙනු ඇත.

**4. විදුලි සේවා ලබාගැනීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් ස්වාධීනත්වය ඉහළ නැංවිය යුතුය.**

ආනයනික සම්පත් මත යැපීම අවම කිරීම සඳහා දේශීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටම් කරා සංවර්ධනය කිරීම තාක්ෂණික, ආර්ථික, පාරිසරික සහ සමාජ සීමාවන්ට යටත්ව සිදු කෙරෙනු ඇත.

නවෝත්පාදනයන් දිරිගැන්වීමේ සහ විදුලිය උපයෝගී කරගන්නා දේශීය ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලබමින් කෘෂිකර්මාන්ත, ග්‍රාමීය සහ ප්‍රාථමික කර්මාන්ත යන ක්ෂේත්‍රයන්හි විදුලිය ක්‍රියාකාරීව ප්‍රයෝජනයට ගනු ලබන නව පාරිභෝගිකයින් දිරිගන්වනු ලැබීමට කටයුතු කෙරෙනු ඇති අතර, එහිදී කාන්තාවන් සහ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත.

**5. විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනවල දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය සහතික කළ යුතුය.**

පිරිවැය පරාවර්තක අයක්‍රම හඳුන්වාදීමට සමගාමීව, විදුලිබල ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව මෙන්ම මූල්‍ය තිරසරභාවය ඉහළ නැංවීම සඳහා ද, පාරිභෝගිකයා වෙත ප්‍රතිලාභ සැලසීමේ අරමුණින් ද යුතුව විදුලිබල ක්ෂේත්‍රයේ නියාමනය ක්‍රම ක්‍රමයෙන් කාර්ය සාධනය මත පදනම් වූ නියාමන ක්‍රමවේදයකට පරිවර්තනය කළ යුතුය.

**3.2. සමගාමී ප්‍රතිපත්ති පිළිබඳ විස්තර**

**I. බලශක්ති කාර්යක්ෂමතාවය සහ විදුලිය සංරක්ෂණය ප්‍රවර්ධනය කළ යුතුය.**

සියලු ක්ෂේත්‍රයන්හි විදුලිය කාර්යක්ෂමව භාවිත කිරීම සම්බන්ධයෙන් ප්‍රවර්ධනය කිරීම බලමුළුගැන්වීමට කටයුතු කරන ලෙස ද, සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයින් යන දෙපිරිසම ඊට සම්බන්ධ කරගන්නා ලෙස ද, වේගයෙන් දියුණු වන තාක්ෂණයන් ඊට උපයෝගී කර ගන්නා ලෙස ද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ අනෙකුත් අදාළ ආයතන වෙත උපදෙස් ලබා දෙනු ලැබේ.

**II. පුනර්ජනනීය බලශක්තිය පාදක විදුලි උත්පාදනයේ දායකත්වය ඉහළ නැංවිය යුතුය.**

අවම පිරිවැයක් යටතේ විදුලිය නිපදවීමට සහ විදුලිබල ක්ෂේත්‍රය තුළ ඉහළ ප්‍රත්‍යාස්ථීතියක් (ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක්) ඇති කිරීම සඳහා දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටමක් කරා සංවර්ධනය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

**III. විදුලිබල ක්ෂේත්‍රයේ උපයෝගීතා ආයතනවල යහපාලනය සහ වගවීම ශක්තිමත් කළ යුතුය.**

වගවීම, සාධාරණත්වය සහ විනිවිදභාවය සහතික කිරීම ඔස්සේ දැරිය හැකි මිලක් යටතේ ගෘහස්ථ, වාණිජ සහ කර්මාන්ත පාරිභෝගිකයින් වෙත විදුලි සැපයීම සඳහා විදුලිබල ක්ෂේත්‍රය තුළ පාලනය ශක්තිමත් කෙරෙනු ඇත. අවසානයේ දී විදුලිබල ක්ෂේත්‍රයේ සියලුම පිරිවැය දැරීමට සිදුවනුයේ පාරිභෝගිකයින්ට බව අවධානයට ගනිමින්, උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පරිපාලනය ප්‍රශස්ත පිරිවැයක් යටතේ සිදු කිරීම සහතික කිරීම සඳහා ස්ථිර ප්‍රතිපත්තියක් සහිත වටපිටාවක් සහතික කිරීම සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සිදු කෙරෙනු ඇත. විදුලිබල ක්ෂේත්‍රයේ බලපත්‍රලාභී ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලවල සියලුම සාමාජිකයින් සහ සේවකයින් සහ එම බලපත්‍රලාභීන් සමඟ ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන සියලුම පුද්ගලයින් මෙම පරමාර්ථ සාක්ෂාත් කරගැනීමෙහිලා වගකිව යුතු වන්නේය. එම සෑම අයෙකුම මීට අදාළව මැදිහත් වී ක්‍රියා කිරීම හෝ මැදිහත් වී ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් සියලුම පාරිභෝගිකයින් කෙරෙහි වගවිය යුතු වන්නේය.

බලපත්‍රලාභීන් විසින් සැලසුම් සහ මෙහෙයුම් කටයුතුවලට අදාළ දත්ත නිවැරදිව සහ නිසි කාලීනව රැස් කර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කළ යුතුය. එසේ සිදු කිරීමට අපොහොසත් වන්නේ නම් ඒ සම්බන්ධයෙන් එවැනි බලපත්‍රලාභී ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සහ සේවකයින් සහ එවැනි බලපත්‍රලාභීන් සමඟ ව්‍යාපාර කරන සියලුම පුද්ගලයින් සෑම පාරිභෝගිකයෙකු කෙරෙහිම වගකිව යුතු වන්නේ ය.

**IV. විදුලි බෙදාහැරීම් පද්ධති සහ පාරිභෝගික සේවා ඩිජිටල්කරණය කඩිනම් කළ යුතුය.**

විදුලිබල ක්ෂේත්‍රයේ මෙහෙයුම්වල විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා මෙන්ම පාරිභෝගිකයින් වෙත ඉහළ මට්ටමේ අත්දැකීමක් ලබාදීම ඉලක්ක කර ගනිමින්, ප්‍රසම්පාදනයේ සිට සුහුරු මනුකරණය දක්වා විදුලි සැපයුම් දාමය ඩිජිටල්කරණය කිරීම කඩිනම් කෙරෙනු ඇත. විදුලිබල පද්ධතිය කළමනාකරණය කරගැනීම සඳහා ඔවුන් ලබාදෙන දායකත්වය සඳහා ඔවුන් හට සාධාරණ ගෙවීමක් ලබා ගැනීමට හැකිවීම සහතික කරමින්, පාරිභෝගිකයින් සඳහා ඉල්ලුමට ප්‍රතිචාර දක්වමින් විදුලිබල පද්ධතිය වෙත දායකත්වය ලබා දීමට හැකියාව සලසමින් නම්‍යශීලී සේවා සැපයීමට හැකි වන පරිදි සුහුරු ජාලය ඉහළ නැංවීමට කටයුතු කෙරෙනු ඇත.

**V. ජාතික පරිසර සහ දේශගුණික ප්‍රතිපත්ති පිළිගත යුතුය.**

විදුලිබල ප්‍රතිපත්තිය ජාතික පාරිසරික සහ දේශගුණික ප්‍රතිපත්ති සමඟ අනුකූල විය යුතුය.

**VI. අනාගත විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් සුරක්ෂිත කළ යුතු අතර අනුමැතිය ලබාගැනීමේ සහ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලීන් විධිමත් කළ යුතුය.**

විදුලිබල ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන කටයුතු උදෙසා අවශ්‍ය ඉඩම් හඳුනා ගනිමින් ඒවායේ හිමිකාරිත්වය තහවුරු කරගැනීමේ අවශ්‍යතාවය සහ සමාජීය බලපෑම් සහ නැවත පදිංචි කිරීමේ පිරිවැය අවම කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, රජය සතු ඉඩම්, විදුලි ජනන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ සැලසුම් මත පදනම්ව අනාගත ව්‍යාපෘති සඳහා වෙන් කිරීම සිදු කෙරෙනු ඇති අතර පරිපාලන ප්‍රමාදයන් අවම කිරීම සඳහා අදාළ අනුමැතිය සහ බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලීන් සඳහා පහසුකම් සැලසීමට කටයුතු කෙරෙනු ඇත.

## 4. ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ සංක්ෂිප්තය

ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය 2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති අතර නියාමක සහ සියලුම බලපත්‍රලාභීන් විසින් පනත හා අනුකූල සහ අනුරූප වන පරිදි මෙය අනුගමනය කළ යුතුය. 2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 4 (10) (v) වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින්, මෙම ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පහසු වීම පිණිස කලින් කලට ලිඛිතව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකිය.

### 4.1 ජාතික අයක්‍රම ප්‍රතිපත්ති ප්‍රකාශනය

විදුලි සැපයුම, ධාරිතාව, විද්‍යුත් බලශක්තිය සහ අනෙකුත් අදාළ සහායක සේවාවන් සැපයීම සඳහා වන මිල ව්‍යුහය පිරිවැය සහ මිල ගණන් සාමූහිකව “විදුලි අයක්‍රම” ලෙස හඳුන්වනු ලැබේ.

1. අයක්‍රම වලට ඇතුළත් කර ඇති විදුලි උත්පාදන පිරිවැය, තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය කරන ලද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් මත පදනම්ව ආරක්ෂක සීමාවන්ට යටත් ආර්ථික ප්‍රේෂණ මෙහෙයවීම සිදු කරනු ලබන බලාගාරවල පිරිවැය මත පදනම් විය යුතුය.

2. තොග මිලදී ගැනීමේ අයක්‍රම, තොග විකුණුම් අයක්‍රම, සම්ප්‍රේෂණ අයක්‍රම, විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදාහැරීමේ අයක්‍රම සහ සැපයුම් අයක්‍රම පිරිවැය පරාවර්තනය විය යුතු අතර, එමගින් නියාමනය කරනු ලබන ආයතන නියමිත කාර්ය සාධන නිර්ණායක සපුරාලීම යටතේ, ඒවායේ මූල්‍යමය තිරසරභාවය සහතික කළ යුතුය.

3. ‘ජාතික විදුලිබල වෙළඳපොළ’ ආරම්භ කෙරෙන තුරු, අවසන් පාරිභෝගික වර්ගීකරණය, අයක්‍රම සහ අයක්‍රම විකල්ප සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා එකම ආකාරයකින් ක්‍රියාත්මක විය යුතුය.

4. ගෘහස්ථ ඒකක සඳහා වන ජීව සහනදායි අයක්‍රම සහ අනෙකුත් සහනාධාරිත අයක්‍රම, ඒ සඳහා සුදුසුකම් ලත් පාරිභෝගිකයින් වෙතම ඉලක්කගත කළ යුතුය. සහනාධාර සඳහා මුදල් යෙදවීම අන්‍යෝන්‍ය සහනාධාරවලින් බැහැරව අයවැයෙන් සෘජුව ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම දක්වා ක්‍රමයෙන් වෙනස් විය යුතුය.

5. ඉහත (3) සහ (4) ප්‍රතිපත්ති ප්‍රකාශයන්හි සීමාවන්ට යටත්ව, එක් එක් පාරිභෝගික කාණ්ඩය සඳහා පිරිවැය පරාවර්තනය වන අයක්‍රම අදාළ විය යුතුය. අහිතකර ලෙස බලපෑමට ලක්වන, සුදුසු පාරිභෝගිකයින් සඳහා අතුරු සහන ලබා දිය යුතුය.

6. ආර්ථික කටයුතු, පිරිවැය සහ තාක්ෂණික වශයෙන් කාර්යක්ෂම භාවිතය, ඉල්ලුම කළමනාකරණය සහ සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය වන පරිදි අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම සැකසිය යුතුය.

7. අයක්‍රම තීරණය කිරීමේ ක්‍රියාවලියේ විවික්ත ලක්ෂණ සහ පුනර්ජනනීය බලශක්ති සම්පත්වල සෘතුමය ස්වභාවය හේතුවෙන් මෙන්ම පොසිල ඉන්ධන මිලෙහි විචලනයන් හේතුවෙන් සිදුවන පාරිභෝගික අයක්‍රම, උච්චාවචනයන් සමනය කළ යුතුය.

8. අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම දකුණු සහ අග්නිදිග ආසියානු කලාපයේ තරඟකාරී ආර්ථිකයන්හි පවතින අයක්‍රම සමඟ සංසන්දනාත්මකව මිනුම්ගත කිරීම /පිල් ලකුණු කිරීම කළ යුතුය.

9. බලපත්‍රලාභීන් ස්වයං-මූල්‍ය පහසුකම් සහිත ආයතන ලෙස මූල්‍යමය වශයෙන් ශක්තිමත් මට්ටමක පවතින බව තහවුරු වන පරිදි අයක්‍රම සකස් කළ යුතුය. මෙම ආයතන ප්‍රමාණවත්ව මූල්‍ය සම්පත් රැස් කරගන්නා තුරු, අත්‍යවශ්‍ය ආයෝජන කටයුතු සඳහා අරමුදල් සපයා ගැනීම සුරක්ෂිත කිරීම සඳහා රජයේ ඇපකර ලබා දීමට කටයුතු කළ යුතුය.

## 5. ප්‍රතිඵල ප්‍රදාන රාමුව

ප්‍රතිඵල ප්‍රදාන රාමුවේ විස්තර කර ඇති ක්‍රියාමාර්ග හරහා මූලික ප්‍රතිපත්ති ප්‍රකාශන සහ සමගාමී ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාත්මක කරනු ලැබේ.

**5.1 මූලික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන ප්‍රතිඵල ප්‍රදාන රාමුව:**

**1. විදුලිබල සැපයුමේ සුරක්ෂිතභාවය සහ ස්වාධීනත්වය ඉහළ නැංවිය යුතුය.**

බලශක්ති සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගත් උපාය මාර්ග ක්‍රියාවට නැංවීම පිණිස පහත සඳහන් ඉලක්ක සහ සන්ධිස්ථාන සපුරා ගැනෙනු ඇත.

(අ) විදුලිබල ක්ෂේත්‍රයේ සුරක්ෂිතබව සහ ස්වාධීනත්වය ඉහළ නැංවීම සඳහා දැවි තෙල් මත පදනම් වූ විදුලි උත්පාදනය වෙනුවට ලාභදායී ප්‍රභවයන් ආදේශ කරගැනීම ප්‍රමුඛතාවයක් ලෙස සලකනු ලැබේ.

(ආ) කඩින් කඩ ස්වභාවයෙන් යුතු, පුනර්ජනනීය බලශක්තිය පාදක කරගත් විදුලිබල උත්පාදනය ඉහළ මට්ටම්වලින් විදුලිබල පද්ධතිය වෙත ඒකාබද්ධ කෙරෙන විට විදුලිබල පද්ධතියෙහි විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා එම පද්ධතිය සවිබල ගැන්වීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) සම්බන්ධිත ක්ෂුද්‍ර ජාල, පසු මනු බැටරි බලශක්ති ගබඩා පද්ධති සහ අථත්‍ය විදුලි බලාගාර වැනි සුහුරු-ජාල සංකල්ප, බලශක්ති සහයෝගීතා ආයතන සහ ඒකරාශීකරණ ආයතන හරහා ප්‍රවර්ධනය කරමින් විදුලි සැපයුම් දාමය තුළ මහජන සහභාගීත්වය ඉහළ නැංවීමට නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් මූලික ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඈ) පොම්ප ගත ජල ගබඩා විදුලි ව්‍යාපෘති පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් කඩිනම් කිරීමටත්, වඩාත් සුදුසු ව්‍යාපෘතිය ජාතික ප්‍රමුඛතාව ලබා දිය යුතු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීමටත්, ප්‍රධාන ජලාශ ආශ්‍රිතව ධාරිතා එක්කිරීම් සම්බන්ධයෙන් මෙන්ම ජලය නිකුත් කිරීම් වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා පවතින ජලාශවල ජල ගබඩාකරණය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සම්බන්ධයෙන් ශක්‍යතාව අධ්‍යයනය කිරීමටත් නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කටයුතු කළ යුතුය.

(ඉ) විදුලිබල පද්ධතිය සම්බන්ධයෙන් වඩාත් හොඳින් සැලසුම් කිරීමටත් මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමටත් හැකියාව ලැබෙන ලෙස, පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කරනු ලබන්නන්ගෙන් ඉදිරි දින සහ දිනක් තුළ ඉල්ලුම් සැපයුම් පුරෝකථන ලබා ගැනීම සඳහා වේදිකාවක් ඇති කිරීමට නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ කටයුතු කළ යුතුය.

(ඊ) විදුලි පද්ධතියට සම්බන්ධ සෑම තාප බලාගාරයකම යම් අවම කාල සීමාවක් සඳහා (අවම පරිභෝජක කාල සීමාවක් සඳහා) උපයෝගී කරගැනීමට ප්‍රමාණවත් උපායමාර්ගික ඉන්ධන සංචිතයක් පවත්වා ගත යුතු අතර එසේ සිදු කිරීමේදී පරිභෝජක අනුපාත, බෙදාහැරීමේ කාල සීමාවන්, තොගවල පිරිවැයට සාපේක්ෂව විකල්ප ඉන්ධනවල පිරිවැය සහ විශ්වාසනීය සැපයුම්කරුවෙකු සිටීම යන කරුණු සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුය.

(උ) විදුලිබල උත්පාදනය සඳහා යොදාගැනෙන දේශීය බලශක්ති සම්පත් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් (ඉන්වෙන්ටරියක්) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සකස් කර ප්‍රකාශයට පත් කළ යුතුය.

**2. විදුලි සේවා සඳහා ආරක්ෂිත සහ සමාජ සාධාරණ ප්‍රවේශය සහතික කළ යුතුය.**

විශ්වාසනීය, පහසු, මිල දැරිය හැකි, සුරක්ෂිත සහ ගුණාත්මක විදුලි සේවාවන් සම්බන්ධයෙන්: (i) සියලුම පුරවැසියන් හට සිය ජීවන තත්ත්වය උසස් කරගැනීම සඳහා ද, (ii) ලාභදායී ආර්ථික ක්‍රියාකාරකම්වල නියැලීම, විශේෂයෙන් ම කුඩා, මධ්‍යම හා ක්ෂුද්‍ර ව්‍යාපාරවල නියැලීම සඳහා ඔවුන්ව දිරිගැන්වීම සඳහා ද ප්‍රමුඛතාව ලබා දී සමාන ප්‍රවේශයක් ඇති කිරීමට කටයුතු කෙරෙනු ඇත.

(අ) සහනාධාර ලැබීමට සුදුසු පාරිභෝගිකයින් වෙත සහනාධාර ලබාදීම සම්බන්ධයෙන් මෙම ප්‍රතිපත්තිය යටතේ අවධාරණය කර ඇත. සහනාධාර සඳහා මුදල් යෙදවීමේදී අන්‍යෝන්‍ය සහනාධාර ක්‍රමයෙන් බැහැරව අයවැය හරහා ඍජුව මුදල් වෙන් කරවා ගැනීම දක්වා ක්‍රමික පරිවර්තනයකට යොමු විය යුතුය.

(ආ) නියාමක විසින් සහන ලැබීම සඳහා සුදුසුකම් ලබන පාරිභෝගික කාණ්ඩ, කලින් කලට සිදු කරනු ලබන සමීක්ෂණ සහ මහජන අදහස් විමසීම් මත පදනම්ව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) විදුලිබල ක්ෂේත්‍රයේ සියලුම ගනුදෙනු සටහන් වන ඩිජිටල් වේදිකාවක් නිර්මාණය කළ යුතුය. මෙම වේදිකාව කර්මාන්ත හා වාණිජ ක්ෂේත්‍ර සඳහා නව විදුලි සම්බන්ධතා ලබාදීම ඇතුළුව ඉලක්කගත දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහ අවදානමට ලක්විය හැකි පාරිභෝගිකයින් සඳහා සමාජ සුරක්ෂණය සැපයීමට යොදා ගැනෙනු ඇත.

(ඈ) අනුකූලතාව, ඒකාබද්ධ කිරීමේ පහසුව සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා විදුලි සැපයුම් දාමයේ භාවිතා වන උපකරණ ප්‍රමිතිගත කෙරෙනු ඇත.

(ඉ) ආරක්ෂිතබව, උසස් ක්‍රියාකාරීත්වය, විශ්වසනීයත්වය සහ තුරු ආවරණය ආශ්‍රිතව ඇති වන බාධා අවම කරගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, සුදුසු තාක්ෂණයන් උපයෝගී කරගනු ලබමින් විදුලි බෙදාහැරීමේ ජාල වැඩිදියුණු කෙරෙනු ඇත.

**3. ප්‍රශස්ත පිරිවැයක් යටතේ ජාතික ආර්ථිකය වෙත විදුලි සේවා සැපයිය යුතුය.**

ජාතික ආර්ථිකය මත ඇති කෙරෙන වැය බර අවම වන පරිදි දිගුකාලීන ප්‍රශස්ත පිරිවැයක් යටතේ බලශක්ති සේවාවන් සපයනු ලැබීම සහතික කිරීම උදෙසා, පහත සඳහන් ඉලක්ක සහ සන්ධිස්ථාන සපුරාලීමට වගකීමෙන් බැඳී සිටින ආයතන කටයුතු කරනු ඇත;

(අ) අවම මිලක් ලබා ගැනීම පිණිස සියලුම ප්‍රසම්පාදනයන්, 2025 අංක 14 දරන පනතින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන වලට යටත්ව තරගකාරී ටෙන්ඩර් කැඳවීම මත පදනම්ව සිදු කෙරෙනු ඇත.

(ආ) සියලුම ආකාරයේ විදුලි උත්පාදනය කිරීම්, සම්ප්‍රේෂණය කිරීම් සහ බෙදාහැරීම්වලට අදාළව විනිවිදභාවයෙන් යුතු සහ පිරිවැය පරාවර්තක මිලකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභීන් විසින් කටයුතු කරනු ඇති අතර නියාමක විසින් පරිපාලනය කරනු ලබන නියාමන යාන්ත්‍රණයක් හරහා එය සිදු කෙරෙනු ඇත.

(ඇ) ජාලක ආරක්ෂණ සීමාවන්ට යටත්ව විනිවිද භාවයෙන් යුතුව යෝග්‍යතා ක්‍රමයකට අනුව පිරිමැසුම් දායක ලෙස උත්පාදන ප්‍රේෂණය කිරීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට් ) ලිමිටඩ් සහතික කරනු ලැබිය යුතුය.

(ඈ) අස්ථායීබව හේතුවෙන් සිදු වන සැපයුම් බිඳවැටීම අවම කර ආර්ථිකය මත ඉන් ඇති වන වැය බර අඩු කිරීමට කටයුතු කෙරෙනු ඇත.

**4. විදුලිබල සේවා ලබා ගැනීම සහ බෙදා හැරීම සම්බන්ධයෙන් ස්වාධීනත්වය ඉහළ නැංවිය යුතුය.**

(අ) පුනර්ජනනීය බලශක්ති සම්පත්, ඒවායේ පිරිවැය,තාක්ෂණික බාධක සහ එක් එක් සම්පත්වල ගුණාත්මකභාවය සැලකිල්ලට ගනු ලබමින් ප්‍රමුඛතා අනුපිළිවෙලක් මත ප්‍රයෝජනයට ගැනෙනු ඇත. මේ සඳහා හැකි සෑම විටම පුනර්ජනනීය බලශක්ති සම්පත් උපයෝගී කරගන්නා මෙන් විදුලිය බෙදාහැරීමේ ආයතන දිරිමත් කෙරෙනු ඇති අතර ඒ තුළින් ගෘහස්ථ, වාණිජ හෝ කර්මාන්ත මට්ටමින් භාවිතා කරන ස්ථානයේ විදුලි ඉල්ලුම ලාභදායි අයුරින් සපුරාලීම කළ හැක.

(ආ) බෙදාහැරීම අනුබද්ධ විදුලි ජනනය, බලශක්ති ගබඩා පද්ධති සහ ඉල්ලුම් පාර්ශව සම්පත් ඇතුළත් විසිරි බලශක්ති සම්පත්, සංඛ්‍යාත ප්‍රතිචාර, වෝල්ටීයතා සහාය, සංචිත, වේගවත් උත්පාදන සහාය සහ අධිභාර කළමනාකරණය වැනි සහායක සේවාවන් සැපයීමට හැකි වන පරිදි ක්‍රම ක්‍රමයෙන් සක්‍රිය කළ හැකිය. එවැනි සහායක සේවාවන්හි තාක්ෂණික සුදුසුකම්, ප්‍රේෂණය සහ වන්දි සඳහා වන රාමු සකස් කළ යුතු අතර රෙගුලාසි, කේත සංග්‍රහ සහ වෙළඳපොළ යාන්ත්‍රණයන් හරහා ක්‍රියාත්මක කළ යුතුය.

(ඇ) අදාළ කේත සංග්‍රහ සහ රෙගුලාසි වලට අනුකූලව, ජාතික විදුලිබල පද්ධතියේ ආරක්ෂාව, විශ්වසනීයත්වය, ජව ගුණාත්මකභාවය සහ ආරක්ෂිත ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම සඳහා අධීක්ෂණය සහ ප්‍රශස්ත ලෙස පාලනය කිරීම සඳහා පද්ධති සංවර්ධනය කළ යුතුය.

(ඈ) නම් කරනු ලබන ජෛව ස්කන්ධ බලශක්ති සංවර්ධන ප්‍රදේශවල බලශක්ති වගාවන් (energy plantation) හෝ ඉන්ධන ලෙස උපයෝගී කරගත හැකි වගාවන් ඇති කිරීම මඟින් විදුලිය උත්පාදනය කිරීම සඳහා ජෛව ස්කන්ධ වාණිජමය වශයෙන් ලබා ගැනීමේ හැකියාව ඉහළ නංවනු ඇත. නාගරික ඝන අපද්‍රව්‍ය විදුලිබල උත්පාදනය සඳහා උපයෝගී කරගැනීම කෙරෙහි පිටුබලය ලබා දිය යුතුය.

**5. විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනවල දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය සහතික කළ යුතුය.**

(අ) විදුලි අයක්‍රම ප්‍රතිපත්තිය තුළ පිරිවැය පරාවර්තක විදුලි අයක්‍රම අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතුය.

(ආ) උපයෝගීතා ආයතනික කාර්ය සාධනය මැනීම සඳහා පිල් ලකුණු (Benchmark) ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය.

(ඇ) බලපත්‍රලාභීන් සම්බන්ධව කාර්ය සාධනය මත පදනම් වූ නියාමන ක්‍රමවේදයක් කරා යොමු වීම පිණිස නියාමක විසින් මාර්ග සිතියමක් සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, එහිදී කාර්ය සාධන දර්ශක සපුරා ගැනීම මත බලපත්‍රලාභීන්ට දිරිගැන්වීම් හිමිවනු ඇත.

(ඈ) කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට මෙන්ම පාරිභෝගික සේවාවන් ගුණාත්මක අයුරින් ලබාදීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන සේවකයින් සඳහා ප්‍රතිලාභ සැලැස්වීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ලෙස බලපත්‍රලාභීන්ව උනන්දු කෙරෙනු ඇත.

(ඉ) විදුලියේ සැබෑ පිරිවැය-පිළිඹිබු වීම සඳහා අන්‍යෝන්‍ය සහනාධාර සහ විවිධ අධිභාර ක්‍රමයෙන් අඩු කිරීම අරමුණු කරමින් නියාමක විසින් මාර්ග සිතියමක් සකස් කළ යුතුය. එම මාර්ග සිතියම තුළ භාවිත කාලය පාදක අයක්‍රමය (Time-of-Use tariff) ක්‍රියාත්මක කිරීමට සහ විනිවිදභාවයෙන් යුතු සාධාරණ සැපයුම් පිරිවැය ගණනය කිරීම් සඳහා මෙන්ම අහිතකර ලෙස බලපෑමට ලක්ව ඇති පාරිභෝගිකයින් සඳහා තාවකාලික සහන (transitional relief) ලබා දීම සඳහා උපාය මාර්ග ඇතුළත් කළ යුතුය.

**5.2 සමගාමී ප්‍රතිපත්ති සම්බන්ධ වන ප්‍රතිඵල ප්‍රදාන රාමුව:**

**I. බලශක්ති කාර්යක්ෂමතාව සහ විදුලිය සංරක්ෂණය ප්‍රවර්ධනය කළ යුතුය.**

(අ) කර්මාන්තයේ භාවිත උපකරණ, ගොඩනැගිලි සහ සියලුම උපකරණවලට අදාළව අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ බලාත්මක කිරීම ද සමඟින් බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය ඉහළ නැංවීම සඳහා මහා පරිමාණ කර්මාන්ත සහ වාණිජ පාරිභෝගිකයින්ගේ බලශක්ති විගණන අනිවාර්ය කිරීම කළ යුතුය.

(ආ) විදුලිබල උත්පාදනය සහ කර්මාන්ත ක්‍රියාවලීන්හි දී බලශක්ති පරිවර්තන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගනිමින් බලශක්ති විගණන සිදු කිරීම සඳහා දිරිගැන්වීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම සිදු කෙරෙනු ඇත.

(ඇ) ජාතික වැඩසටහනක් හරහා මහජනතාව අතර බලශක්ති කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. බලශක්තිය සංරක්ෂණය කිරීමේ ප්‍රයත්නයන් සඳහා පාරිභෝගිකයින් දායක කරගැනීම පිණිස ඒ සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.

**II. පුනර්ජනනීය බලශක්තිය පාදක විදුලි උත්පාදනයේ දායකත්වය ඉහළ නැංවිය යුතුය.**

(අ) පුනර්ජනනීය බලශක්තිය උපයෝගී කරගැනීම උපරිම මට්ටමක් කරා ගෙන ඒම සඳහා, පුනර්ජනනීය බලශක්තියෙන් උත්පාදිත අතිරික්ත විදුලිය, විදුලිබල පද්ධතිය වෙත අවශෝෂණය කර ගැනීම පිණිස විදුලිය ගබඩා කිරීමට හැකි තාක්ෂණයන්ගේ මිශ්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය. ගබඩාකරණ විකල්ප සැලසුම් කිරීමේදී, පද්ධති අවශ්‍යතා, ජීවන චක්‍ර පිරිවැය, ප්‍රතිචාර දැක්වීමේ හැකියාව, මහජන ආරක්ෂාව සහ පාරිසරික හා සමාජීය බලපෑම් සලකා බැලීමට ලක් කෙරෙන සහ විනිවිදභාවයෙන් යුතු තාක්ෂණික-ආර්ථික නිර්ණායක අනුගමනය කිරීමට නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කටයුතු කළ යුතුය.

(ආ) එවැනි උත්පාදන පිරිවැය ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීම සඳහා සියලු පුනර්ජනනීය බලශක්ති පාදක විදුලි ප්‍රසම්පාදන කටයුතු පූර්ණ වශයෙන් නියාමනය කෙරෙන තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියකට අනුව සිදු කෙරෙනු ඇති අතර ඉන් පාරිභෝගිකයින් සඳහා පුනර්ජනනීය බලශක්ති ආශ්‍රිතව උපරිම ප්‍රතිලාභ ලබා දීම අරමුණු කෙරෙනු ඇත. කොන්ත්‍රාත්තුවේ දී අවශෝෂක අයක්‍රම හා එකඟ වී ඇති අවස්ථාවක දී, අදාළ නීතිවලට යටත්ව එම කොන්ත්‍රාත්තු සඳහා ගෙවීම් සිදු කරනු ලැබේ. නීති ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඇති එහෙත් තවමත් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර නොමැති පුද්ගලයින් සම්බන්ධයෙන් අදාළ නීතියට අනුකූලව නිසි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඇ) (2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත) 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට යටත්ව, සහ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග 2019 හි දක්වා ඇති ස්ථාවරයන්ට අනුකූලව, එක් එක් පුනර්ජනනීය බලශක්ති තාක්‍ෂණයේ වාණිජ පරිණතභාවයට ලඟා වූ පසු අනාගත උත්පාදන ධාරිතා එක් කිරීම් සඳහා ලබා දෙන අවශෝෂක අයක්‍රම අදියරගත කරනු ලැබේ.

(ඈ) සහායක සේවා වෙළඳපොළට විදුලිය ගබඩාකරණ සේවා ඇතුළත් කිරීම සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මාර්ග සිතියමක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.

**III. විදුලිබල ක්ෂේත්‍රයේ උපයෝගිතා ආයතනවල යහපාලනය සහ වගවීම ශක්තිමත් කළ යුතුය.**

(අ) සෑම බලපත්‍රලාභියෙක්ම දත්ත රැස් කිරීම, සම්පාදනය කිරීම සහ ඒවා නියාමක වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකියනු ලබන සුදුසු නිලධාරියෙකු පත් කළ යුතු වන අතර නියාමක විසින් ඒ සඳහා බලපත්‍රලාභීන් වෙත බලය පැවරීමට කටයුතු කළ යුතුය.

(ආ) අයකුම සකස් කිරීමේදී සහ ගණනය කිරීමේදී, නියාමක විසින් තීරණය කරනු ලබන අයකුමවලට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන පිරිවැයට අදාළ මූල්‍ය තොරතුරු ඇතුළත්ව සියලුම තොරතුරු නියාමක වෙත ලබා දීමට උත්පාදන, සම්ප්‍රේෂණය, බෙදා හැරීම ආශ්‍රිතව සම්බන්ධ වී සිටින සහ නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සියලු අයවලුන් විසින් කටයුතු කළ යුතුය.

(ඇ) පද්ධති සීමාවන්ට යටත්ව, එම සියලු වියදම් වෙළඳපොලේ පවතින අවම පිරිවැය බවට සාධාරණීකරණය කිරීමට බලපත්‍රලාභීන් විසින් කටයුතු කළ යුතුය.

(ඈ) සියලුම නව විදුලි උත්පාදනයන් විවෘත හා විනිවිදභාවයකින් යුතු ලංසු තැබීමේ ක්‍රියාවලියක් මත පදනම්ව ප්‍රසම්පාදනය කෙරෙනු ඇත.

(ඉ) නියාමක විසින්, එම ක්‍රමවේද සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී, සහ 2025 අංක 14 දරන පනත මගින් සංශෝධිත 2024 ශ්‍රී ලංකා විදුලිබල පනත සහ ඒ යටතේ සාදන ලද නියෝග බලාත්මක කිරීමේදී, විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් වන කිසිදු ඒකාධිකාරයකට, සීමිත තරඟකාරිත්වයකට, හෝ මිල ඉහළ තබා ගැනීම පිණිස නිපැයුම් සැපයුම් පාලනය සඳහා ඇති කරගන්නා සන්ධාන ගත වීමකට අවසරය හෝ ඒවා සිදු කරගෙන යාමට ඉඩ ප්‍රස්ථාව නොසැලසෙන බව සහතික කරනු ඇත.

(ඊ) මෙම ප්‍රතිපත්තියේ විධිවිධාන අදාළ කර ගනිමින්, අයකුම ක්‍රමවේදය සහ ගණනය කිරීමේ පියවර ඇතුළත් සවිස්තරාත්මක තොරතුරු සටහනක් නියාමක විසින් සකස් කොට, පාරිභෝගික අයකුම පිළිබඳ මහජන අදහස් විමසීමට පෙර ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කරනු ඇත.

(උ) කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රතිලාභ සහ දණ්ඩන ඇතුළත් කරමින් කාර්ය සාධනය මත පදනම් වූ නියාමනයක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

**IV. විදුලි බෙදාහැරීමේ පද්ධති සහ පාරිභෝගික සේවා ඩිජිටල්කරණය කඩිනම් කළ යුතුය.**

(අ) බලපත්‍රලාභීන් විසින් සිය කටයුතු ඩිජිටල්කරණය කිරීම සහ ස්වයංක්‍රියකරණය කිරීම මගින් ඔවුන්ගේ සියලු ක්‍රියාවලීන්හි ඵලදායිතාව උසස් කරගැනීමට පියවර ගත යුතුය.

(ආ) කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වත්කම් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම අරමුණු කරමින්, සුහුරු ජාල තාක්ෂණයන්, කෘතිම බුද්ධිය පාදකව ක්‍රියාවලින් ස්වයංක්‍රියකරණය කිරීම, අන්තර්ජාලයට සම්බන්ධිත උපාංග හරහා බලශක්ති වත්කම් අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සහ විසිරි දත්ත පද්ධති වැනි තාක්ෂණයන් පාදක කරගනිමින් වෙනස් කළ නොහැකි අයුරින් දත්ත වාර්තා පවත්වා ගැනීම සහ ගනුදෙනු සිදු කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දෙනු ලැබීම සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මාර්ග සිතියමක් සකස් කිරීම සහ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

(ඇ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නියාමකගේ අධීක්ෂණය යටතේ, සයිබර් ප්‍රහාරවලට එරෙහිව ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා සියලුම බලපත්‍රලාභීන්ට අදාළ වන පරිදි 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත ඇතුළු ගෝලීය සහ දේශීය වශයෙන් ක්‍රියාත්මක ප්‍රශස්ත භාවිතයන්ට අනුකූලව සයිබර් ආරක්ෂණ සහ දත්ත සුරක්ෂිත කිරීමේ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.

(ඈ) ජාතික විදුලිබල වෙළඳපොළ අදියරෙන් අදියර ස්ථාපිත කෙරෙමින් පවතින හෙයින්, නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රමාදය අවම අයුරින් දත්ත ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම උදෙසා මාර්ග සිතියමක් සකස් කිරීමටත්, එය ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

**V. ජාතික පරිසර සහ දේශගුණික ප්‍රතිපත්ති පිළිගත යුතුය.**

(අ) රජය විසින් ලබා දී ඇති අදාළ සියලුම පොරොන්දුමය බැඳීම් මෙම ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යටතේ පිළිගනු ලබන්නේ ය. විදුලිබල විෂය භාර අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව එවැනි බැඳීම් වලට එළැඹීම සිදු කළ යුතුය.

(ආ) එවැනි බැඳීම් ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රතිපත්තියේ මූලික මූලධර්මවලට අනුකූල වන ආකාරයෙන් සිදු කළ යුතුය.

**VI. අනාගත විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් සුරක්ෂිත කළ යුතු අතර, අනුමැතිය ලබාගැනීමේ සහ බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලීන් විධිමත් කළ යුතුය.**

ඇතැම් තාක්ෂණයන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන විශේෂිත පිහිටීම් සහිත ඉඩම් සීමිතවීම සැලකිල්ලට ගනිමින් සහ විදුලි බලාගාර සහ සම්ප්‍රේෂණ වත්කම් ඉදිකිරීමේදී ඉදිකරනු ලබන භූමි පිහිටා ඇති ස්ථාන සහ මාර්ග වෙනස් කිරීමට සිදුවීමෙන් මින් පෙර සිදු වී ඇති විශාල මූල්‍ය අලාභ සැලකිල්ලට ගනිමින්, ඉදිරියේදී සිදු කිරීමට නියමිත විදුලිබල යටිතල පහසුකම් ස්ථාපිත කිරීම් සඳහා උපායමාර්ගික පිහිටීමක් සහිත ස්ථාන සහ මාර්ග කල් තබා වෙන් කරවා සුරක්ෂිත කිරීම සිදු කෙරෙනු ඇති අතර එවැනි පහසුකම් නිසි කාලීනව ක්‍රියාත්මක කිරීම සහ අහිතකර සමාජීය හා පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා උපාය මාර්ග භාවිත කිරීම සිදු කෙරෙනු ඇත. එවැනි පහසුකම් නිසි කලට ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සහ අහිතකර සමාජීය හා පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා වඩාත් සුදුසු ආකාරයෙන් ප්‍රසම්පාදනය සිදු කළ යුතුය.

(අ) විදුලිබල ක්ෂේත්‍රයේ අනාගත යටිතල පහසුකම් සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථාන සහ මාර්ග, මූලික ශක්‍යතා අධ්‍යයනවලින් පසුව, උපායමාර්ගිකව කල් තබා වෙන් කරවා ගැනීමට කටයුතු කෙරෙන අතර, එමඟින් මහජනතාව එවැනි ස්ථාන හෝ මාර්ග භාවිත කිරීම වළක්වා ගැනීමට ද, වෙනත් ස්ථානයකට ගෙන යාමට සිදුවීම මෙන්ම සංවර්ධන කටයුතු සිදු කෙරෙන සමයේ දී සමාජීය බලපෑම් ඇති වීම ද අවම කරගැනීමට හැකි වනු ඇත.

(ආ) සුළං සහ සූර්ය බලශක්ති බලාගාර වැනි මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම් ස්ථානගත කිරීම සඳහා වඩාත් උචිත ස්ථාන කල් තබා හඳුනා ගනිමින් ප්‍රධාන සැලැස්මක් තුළට ඇතුළත් කෙරෙනු ඇති අතර එමඟින් ඒවා විශාල, කේන්ද්‍රගත වූ පහසුකම් ලෙස අදියර වශයෙන් සංවර්ධනය කළ හැකි වනු ඇත.

(ඇ) ජාතික යටිතල පහසුකම් සැලසුම්කරණයේ ප්‍රයෝජනය තකා පොදුවේ භාවිතයට ගෙන ඇති අභ්‍යන්තර මාර්ග සඳහා ප්‍රමුඛතාව දක්වමින් සම්ප්‍රේෂණ රැහැන් සඳහා මාර්ග හඳුනාගැනීමට කටයුතු කෙරෙනු ඇත. මහජනතාව වෙත පෙර දැනුම්දීමේ අරමුණින් යුතුව එම හඳුනාගත් මාර්ග පිළිබඳව ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

(ඈ) බහුවිධ නල මාර්ග සහ විදුලි සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඇතිරීම සඳහා දැනට පවතින මාර්ග හැකි සෑම විටම යොදාගැනෙනු ඇත.

(ඉ) අනාගතයේ ඉදිකෙරෙන භූගත කේබල් මාර්ග සහ නල මාර්ග ප්‍රශස්ත ලෙස ස්ථානගත කිරීම පහසු කරවීම සඳහා විදුලිය, ජලය, සන්නිවේදනය, ගෑස් සහ ඛනිජ තෙල් ඇතුළු දැනට පවතින සහ අනාගත භූගත උපයෝගිතා සේවා යටිතල පහසුකම් සියල්ලම පොදු හා විධිමත් භූගෝලීය තොරතුරු පද්ධතියකට ඇතුළත් කෙරෙනු ඇත.

(ඊ) විදුලිය බෙදා හැරීම, මලාපවහන, ජලය, සන්නිවේදනය සහ ගෑස් සැපයුම ඇතුළු මහා මාර්ගය ආශ්‍රිත උපයෝගිතා යටිතල පහසුකම් සම්බන්ධ මාර්ග, හිමිකාරිත්වය පැහැදිලිව නිර්ණය කිරීම, නඩත්තු කිරීමේ නම්‍යශීලීභාවය සහ පුළුල් කිරීම සඳහා ඉඩකඩ සහතික වන ආකාරයට, ප්‍රවාහන යටිතල පහසුකම් සමඟ සම්බන්ධීකරණය කෙරෙනු ඇත.

(උ) පුනර්ජනනීය බලශක්ති සහ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘති සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන බොහෝමයක් සම්බන්ධ කරගැනීමට සිදුවීමත්, එම ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා ගැනීමේදී එම ක්‍රියාවලියෙහි පවතින සංකීර්ණත්වය කෙරෙහිත් සලකා බලමින්, අනුමැතිය ලබා ගැනීමේ විධිමත් ක්‍රියාවලියක් සඳහා පොදු වේදිකාවක් සකස් කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කළ යුතුය.

# ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය

**බලශක්ති අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා රජය**

**2026.03.03**

ශ්‍රී ලංකාව තුළ විදුලිබල පිරිවැය සහ මිල තීරණය කිරීමට අදාළ ප්‍රතිපත්තිය, උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග සඳහා වන කාල රාමු ප්‍රකාශයට පත් කිරීම පිණිස බලශක්ති අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ලේඛනයකි.

2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුකූලව 2026. 03. 03 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මෙම අයක්‍රම ප්‍රතිපත්තිය ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ කොටසක් වන ජාතික විදුලිබල ප්‍රතිපත්තියෙහි විස්තර කර ඇති රජයේ ප්‍රතිපත්තිමය රාමුව මත පදනම් වී ඇත. මෙම අයක්‍රම ප්‍රතිපත්තිය සහ ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යන දෙකම අනුමත කළ දින සිට වසර පහකට වරක් හෝ, ඊට පෙර ඕනෑම අවස්ථාවකදී හදිසි අවශ්‍යතාවයක් පැනනැඟුණු අවස්ථාවක, සංශෝධනය කරනු ලැබිය හැකිය.

පටුන

කෙටි යෙදුම් සහ ඒකක ........ 13A

1. **හැඳින්වීම** ........ 14A
2. **අයක්‍රම ප්‍රතිපත්තියේ අරමුණු** ........ 16A
3. **ප්‍රතිපත්ති ප්‍රකාශය** ........ 17A
4. **උපාය මාර්ග** ........ 17A
5. **ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව** ........ 19A

**කෙටි යෙදුම් ලැයිස්තුව**

| | |
|---|---|
| BST | තොග සැපයුම් ගාස්තු |
| BSTA | තොග සැපයුම් ගනුදෙනු ගිණුම |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය |
| CEBEF | සීඊබී එම්ප්ලෝයීස් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| CPI | පාරිභෝගික මිල දර්ශකය |
| EDL | ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් |
| EGL | ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් |
| EVL | එනර්ජි වෙන්චර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් |
| IPP | ස්වාධීන බලශක්ති නිෂ්පාදකයෝ |
| LECO | සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| LKR | ශ්‍රී ලංකා රුපියල් |
| MOE | බලශක්ති අමාත්‍යාංශය (පෙර - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) |
| MOF | මුදල් අමාත්‍යාංශය |
| MOPE | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (වර්තමානයේ බලශක්ති අමාත්‍යාංශය) |
| MYT | බහු-වසර අයක්‍රම |
| NSO | නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| NTNSP | නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් (ප්‍රයිවට) ලිමිටඩ් |
| O&M | මෙහෙයුම් සහ නඩත්තු |
| PPA | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| PSA | විදුලිය අලෙවි කිරීමේ ගිවිසුම |
| PUCSL | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| SLSEA | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| SPPA | සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| TSA | සම්ප්‍රේෂණ සේවා ගිවිසුම |
| TOU | භාවිත කරන වේලාව |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය |

**ඒකක**

| | |
|---|---|
| kWh | කිලෝවොට් පැය |
| MW | මෙගාවොට් |
| V | වෝල්ට් |
| W | වොට් |

## 1. හැඳින්වීම

මෙම ජාතික විදුලිබල අයක්‍රම ප්‍රතිපත්තිය, 2025 අංක 14 දරන පනතින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇති අතර, නියාමක සහ සියලුම බලපත්‍රලාභීන් විසින් පනතේ විධිවිධාන හා අනුකූලව මෙය අනුගමනය කළ යුතුය. 2025 අංක 14 දරන පනතින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 4 (10) (v) වගන්තිය ප්‍රකාරව, මෙම ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට ලිඛිතව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකිය.

### 1.1. පසුබිම

රජය සතු සංස්ථාවක් වන ලංකා විදුලිබල මණ්ඩලය (CEB), 1969 වසරේ සිට ශ්‍රී ලංකාවේ විදුලි සැපයුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම උපයෝගිතා ආයතනය ලෙස කටයුතු කර ඇත .1969 සිට 1995 දක්වා කාලය තුළ, ලංකා විදුලිබල මණ්ඩලය සියලුම විදුලි උත්පාදන පහසුකම්වල හිමිකාරීත්වය දැරීම ද, මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම ද සිදු කළ අතර ඉන් පසුව නව විදුලි උත්පාදනය සඳහා ආයෝජනය කිරීමට පෞද්ගලික අංශයට ආරාධනා කරන ලදී. 2024 වසර අවසානය වන විට, රටේ මුළු විදුලි උත්පාදන ධාරිතාවෙන් 55%ක් ලංකා විදුලිබල මණ්ඩලය සතු වූ අතර, එමඟින් සමස්ත බලශක්ති අවශ්‍යතාවයෙන් 66%ක් සපුරාලන ලදී. වහල මත සවිකරන සූර්ය බලශක්ති පද්ධති ඇතුළුව ඉතිරි ධාරිතාව සහ බලශක්ති ප්‍රමාණය පෞද්ගලික ආයෝජකයින් විසින් සපයන ලදී.

1996 වසරේ සිට, තෙල් මත පදනම් වූ තාප විදුලි උත්පාදනය සඳහා පෞද්ගලික ආයෝජන කැඳවනු ලැබූ අතර, හඳුන්වාදීමේ පියවරක් ලෙස පුනර්ජනනීය බලශක්තිය පදනම් කරගත් විදුලි උත්පාදනය දිරිමත් කිරීම සඳහා සැපයුම් මත පදනම් වූ අවශෝෂක අයක්‍රම (feed-in-tariffs) හඳුන්වා දෙන ලදී. 2024 වසර අවසානය වන විට, ලංකා විදුලිබල මණ්ඩලය සතු බලාගාර 29ක් (පුනර්ජනනීය 20ක් සහ තාප විදුලි 9ක්), පෞද්ගලික විදුලි නිෂ්පාදකයින් 346ක (තාප විදුලි 2ක් සහ අනෙක්වා පුනර්ජනනීය) සහ වහල මත සවිකරන සූර්ය බලශක්ති ඒකක 93,064ක් මෙරට පද්ධතිය තුළ ක්‍රියාත්මක විය.

විදුලි සම්ප්‍රේෂණය සහ පද්ධති මෙහෙයුම් කටයුතු ද 1969 වසරේ සිට ලංකා විදුලිබල මණ්ඩලය සතු අනන්‍ය අයිතියක්ව පැවතුණි.

1983 වසරේදී සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) ස්ථාපිත කරන ලදී. භාණ්ඩාගාරය, ලංකා විදුලිබල මණ්ඩලය සහ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) ප්‍රධාන කොටස්කරුවන් ලෙස දායක වන අතර තවත් දේශීය රාජ්‍ය ආයතන හතරක් මෙහි සුළු කොටස්කරුවන් ලෙස දායක වේ. 2024 වසර අවසානය වන විට, ලංකා විදුලි පුද්ගලික සමාගම පාරිභෝගිකයින් 631,000කට පමණ සේවය සැපයූ අතර, එය රටේ මුළු පාරිභෝගිකයින් මිලියන 7.73කින් 8%ක පමණ ප්‍රතිශතයක් වේ. ඉතිරි පාරිභෝගිකයින් මිලියන 7.1 ක පිරිසකට ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ අංශ හතර මඟින් සේවා සපයනු ලැබේ. ශ්‍රී ලංකාවේ විදුලි බෙදාහරින්නන් විසින් බෙදාහැරීමේ ජාල පවත්වාගෙන යාම සහ විදුලිය සැපයීම යන කාර්යයන් දෙකම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ මෙහෙයුම් ඒකල (තනි) ගැනුම්කරු ආකෘතිය අනුගමනය කරන අතර, ඒ අනුව සියලුම විදුලි උත්පාදනයන් ලංකා විදුලිබල මණ්ඩලයේ රැහැන්ගත නොවන සම්ප්‍රේෂණ අංශයට විකිණීම අනිවාර්ය වේ. මෙම අංශය කාර්යයන් තුනක් ඉටු කරයි: (i) තනි ගැනුම්කරු, (ii) තොග සැපයුම්කරු, සහ (iii) පද්ධති ක්‍රියාකරු.

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත (2025 අංක 14 දරන පනතින් සංශෝධිත) මගින් ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ස්වාධීන වූ පහත සඳහන් වෙනම සමාගම් වලට වෙන් කිරීමට විධිවිධාන සලසා ඇති අතර එම සමාගම්, පනතේ කොන්දේසි ප්‍රකාරව නියාමනයට යටත් වේ.

(අ) ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (EGL)

(ආ) නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රොවයිඩර් (ප්‍රයිවට්) ලිමිටඩ් (NTNSP)

(ඇ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (NSO)

(ඈ) ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (EDL)

### 1.2. 2009 අංක 20 දරන විදුලිබල පනත යටතේ ආර්ථික නියාමනය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මඟින් ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යයන් සඳහා වෙන වෙනම බලපත්‍ර ලබා ගැනීම අනිවාර්ය කළ අතර, එමඟින් ලංකා විදුලිබල මණ්ඩලය එකම ආයතනයක් තුළ පවතින පරිදි එහි කාර්යභාරයන් අනුව වෙන් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය වෙත බලපත්‍ර හයක් නිකුත් කරන ලදී: එනම් උත්පාදනය සඳහා එක් බලපත්‍රයක් ද, සම්ප්‍රේෂණය සඳහා එක් බලපත්‍රයක් ද (සම්ප්‍රේෂණ ජාලය, තොග සැපයුම් සහ මෙහෙයුම් කාර්යයන් ආවරණය වන පරිදි), සහ විදුලිය බෙදාහැරීම සහ සැපයීම සඳහා බලපත්‍ර හතරක් ද (ලංකා විදුලිබල මණ්ඩලය තුළ ඒ වන විටත් පිහිටුවා තිබූ බෙදාහැරීමේ අංශ හතරට අනුකූල වන පරිදි) වේ. ලංකා විදුලි (පුද්ගලික) සමාගම, ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශයෙන් විදුලිය මිලදී ගෙන එය බෙදාහැරීම සහ පාරිභෝගිකයින්ට සැපයීම සිදු කරන වෙනම බලපත්‍රලාභී බෙදාහැරීමේ සමාගමක් ලෙස තවදුරටත් කටයුතු කරන ලදී.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින්, ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික සහ ආරක්ෂණ නියාමක ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) වෙත බලතල පවරා ඇත. අනෙකුත් අවශ්‍යතා අතර, සම්ප්‍රේෂණ හා තොග සැපයුම් අයක්‍රම මෙන්ම බෙදාහැරීමේ හා සැපයුම් අයක්‍රම ද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය පරාවර්තිත ක්‍රමවේදයකට (cost reflective methodology) අනුකූලව එම කොමිෂන් සභාව විසින්ම තීරණය කළ යුතුව තිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2011 වසරේදී අයක්‍රම ක්‍රමවේදය ප්‍රකාශයට පත් කරන ලද අතර, එය 2015[1] සහ 2021[2] වසරවලදී යාවත්කාලීන කරන ලදී. 2011 අයක්‍රම ක්‍රමවේදය මගින් (අ) වසර පහක පාලන කාල සීමාවක් සහිත සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අයක්‍රම සඳහා බහු-වසර අයක්‍රම[3] (multi-year tariff - MYT) තීරණය කිරීමේ ක්‍රියා පටිපාටියක් ද, (ආ) මාස හයක පාලන කාල සීමාවක් සහිත තොග සැපයුම් අයක්‍රම (ජනවාරි සිට ජූනි දක්වා සහ ජූලි සිට දෙසැම්බර් දක්වා) ද ස්ථාපිත කරන ලදී. අනාවැකි පළ කරන ලද මාස හයක තොග සැපයුම් අයක්‍රම තීරණය කිරීමේ ක්‍රියා පටිපාටිය මෙම ක්‍රමවේදය මගින් ස්ථාපිත කරන ලද අතර, එහිදී පෙර මාස හයක පාලන කාල සීමාව තුළ වූ අනාවැකිගත පිරිවැය සහ සැබෑ තොග සැපයුම් පිරිවැය අතර පවතින ඕනෑම නොගැලපීමක් පිළිබිඹු වන පරිදි එම අයක්‍රම සංශෝධනය කරනු ලබයි. පොදු ඒකීය ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා තොග සැපයුම් අයක්‍රමය සංශෝධනය කිරීමේ ක්‍රියා පටිපාටිය ද මෙම ක්‍රමවේදය මගින් ස්ථාපිත කරන ලදී. එමෙන්ම, අනාවැකි පළ කරන ලද පාරිභෝගික මිශ්‍රණය සහ සැබෑ පාරිභෝගික මිශ්‍රණය අතර පවතින නොගැලපීම හේතුවෙන් ඇති වන ඕනෑම ආදායම් අඩුවීමක් හෝ අතිරික්තයක් නිවැරදි කිරීම සඳහා ද එම ක්‍රියා පටිපාටිය මඟ පෙන්වයි.

සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අයක්‍රම සඳහා ප්‍රථම ගොනු කිරීම 2010 වසරේදී සිදු කරන ලද්දේ, 2011 ජනවාරි මාසයේ සිට ආරම්භ වූ පළමු පාලන කාල සීමාව සඳහාය. 2011-2020 කාලය තුළ වසර පහ බැගින් වූ චක්‍ර දෙකක් අවසන් කිරීමෙන් පසුව, 2021 වසරේ සිට සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අයක්‍රම සඳහා වන බහු-වසර අයක්‍රම පාලන කාල සීමාව වසර තුනක් ලෙස ස්ථාවර කර ඇත. සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අයක්‍රම සඳහා වන සිව්වන බහු-වසර අයක්‍රම පාලන කාල සීමාව 2024 වසරේදී ආරම්භ වූ අතර 2026 වසරෙන් අවසන් වේ. 2011 ජනවාරි මාසයේ සිට මාස හයක්ව පැවති තොග සැපයුම් අයක්‍රම සඳහා වූ පාලන කාල සීමාව, 2024 වසරේ සිට මාස තුනක් දක්වා (එනම් කාර්තුමය පදනමින්) අඩු කර ඇත.

අයක්‍රම ගොනු කිරීමේ සහ තීරණය කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, 2016 වසරේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අයක්‍රම තීරණය කිරීම සඳහා වන රීති[4] නිකුත් කරන ලදී. බලපත්‍රලාභීන් විසින් අයක්‍රම ගොනු කිරීමේදී පුරෝකථනය කළ උත්පාදන, සම්ප්‍රේශන හා බෙදාහැරීම් දත්ත හා පිරිවැය සහ බලපත්‍රලාභීන් විසින් පසුව ඉදිරිපත් කරන දත්ත හා පිරිවැය, එම කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආකෘති පත්‍ර සහ සැකැසුම් මගින් විධිමත් කර ඇත.

## 1.3. 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ආර්ථික නියාමනය පිළිබඳ විධිවිධාන

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ පිහිටුවන ලද සමාගම් හතරෙහි කාර්යභාරයන් පහත පරිදි වේ**:**

(අ) ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ;
*කාර්යයන්: විදුලිය උත්පාදනය කිරීම, ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම බලාගාරවල වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු පවරා ගැනීම.*

(ආ) නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් (ප්‍රයිවට්) ලිමිටඩ් ;
*කාර්යයන්: ජාතික පද්ධතිය සමන්විත වන භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ මෙහෙයවීම මෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ පද්ධතියට අදාළ සියලුම වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු පවරා ගැනීම.*

(ඇ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් ;
*කාර්යයන්: විදුලි උත්පාදන කාලසටහන්ගත කිරීම, බලාගාර පද්ධතියට සම්බන්ධ කිරීම (Commitment) සහ ආර්ථික පිරිවැය මත පදනම්ව ප්‍රේෂණය මෙහෙයවීම (Economic Dispatch) මෙන්ම අනාගත විදුලි උත්පාදන සහ සම්ප්‍රේෂණ ධාරිතාව සැලසුම් කිරීමට අදාළ කාර්යයන්.*

(ඈ) ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ;
*කාර්යයන්: විදුලිය බෙදාහැරීම සහ සැපයීම මෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ අංශ හතරේ (04) වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු පවරා ගැනීම.*

---

1 ගාස්තු ක්‍රමවේදය 2015 නොවැම්බර්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL). https://www.pucsl.gov.lk/wp-content/uploads/2018/04/Tariff-Methodology-2015

2 ගාස්තු ක්‍රමවේදය 2021 ජනවාරි, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL). https://www.pucsl.gov.lk/wp-content/uploads/06/2022/Tariff-Methodology-amended-Version_2021.pdf

3 බහු වසර අය ක්‍රමය යනු නියාමයට ලක්වන ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත පදනම්ව, සාමාන්‍යයෙන් වසර 3 සිට 5 දක්වා කාලයක් සඳහා අදාළ වන අයක්‍රම පිළිබඳ නියාමනයකින් යුතුව නිර්ණය කිරීමයි.

4 ගාස්තු සමාලෝචනය සහ ගැලපීම සඳහා වූ ක්‍රියාපටිපාටිය, 2016 අංක 03 දරන රීති, අංක 21/1978 දරන ගැසට් පත්‍රය - 2016 අගෝස්තු 02, අභහරුවාදා.

පත් කරන ලද දින සිට ක්‍රියාත්මක වන පරිදි, සෑම සමාගමක්ම ලංකා විදුලිබල මණ්ඩලයේ පහත සඳහන් වත්කම් සහ ක්‍රියාකාරකම් පවරා ගැනීම, ඒවායේ අයිතිය දැරීම සහ මෙහෙයවීම සිදු කරනු ලබයි:

ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්: ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලුම උත්පාදන සහ ඒ ආශ්‍රිත වත්කම්
නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් (ප්‍රයිවට්) ලිමිටඩ්: ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලුම සම්ප්‍රේෂණ වත්කම්
නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ්: ලංකා විදුලිබල මණ්ඩලය සතු රඟැන්ගත නොවන සම්ප්‍රේෂණ මට්ටමේ සියලුම මෙහෙයුම් කටයුතු (තොග සැපයුම් සහ පද්ධති මෙහෙයුම් කටයුතු).
ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්: කොට්ඨාස හතරකින් (04) සමන්විත, ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලුම බෙදාහැරීමේ වත්කම් සහ සිල්ලර සේවා.

විදුලිබල පනතේ I වන උපලේඛනයෙහි විස්තර කර ඇති විදුලිබල කර්මාන්තයේ ව්‍යුහයට අනුකූලව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත තවත් සීමිත වගකීම් සහිත සමාගම් දෙකක් මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ ඉතිරි වත්කම් සහ කාර්යයන් පවරා ගනු ලැබේ.

(අ) සීඊබී එම්ප්ලෝයිස් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් (CEBEF);
(ආ) එනර්ජි වෙන්චර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (EVL)

ඉහත සඳහන් ආයතනවලට අමතරව, 2024 වසර අවසානය වන විට පෞද්ගලික විදුලි නිෂ්පාදකයින් 346ක් (තාප විදුලි බලාගාර 2ක් සහ පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් අනෙකුත් බලාගාර) සහ වහල මත සවිකළ සූර්ය බලශක්ති ඒකක 93,064ක් ක්‍රියාත්මක මට්ටමේ පවතියි.

ලංකා විදුලි (පුද්ගලික) සමාගම එහි සේවා බල ප්‍රදේශය තුළ විදුලිය බෙදාහරින්නෙකු සහ සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කරනු ඇත.

ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් සමාගම සතු සෑම බලාගාරයක්ම නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට එළඹෙනු ඇත. සියලුම පෞද්ගලික විදුලි නිෂ්පාදකයින්, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට (මෙගාවොට් 10කට වඩා වැඩි බලාගාර සඳහා) හෝ සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට (මෙගාවොට් 10 දක්වා වූ පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාර සඳහා) එළඹෙනු ඇත. 2009 සිට ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් වහල මත සවිකළ සූර්ය බලශක්ති ඒකක සම්බන්ධයෙන්, පද්ධතිගත (on-grid) වහල මත සවිකළ සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා (solar photovoltaic - PV) උත්පාදන පහසුකම් සඳහා වන ගිවිසුම්වලට දැනටමත් එළඹ ඇත. මෙම ගිවිසුම් ඉදිරියේදී නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පවරා දෙනු ලැබේ.

නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් විදුලිය තොග වශයෙන් මිලදී ගැනීම, විකිණීම සහ පද්ධති මෙහෙයුම් කටයුතු සිදු කළ යුතුය. 2025 අංක 14 දරන පනතින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන පරිදි, විවෘත ප්‍රවේශ (Open Access) ක්‍රමය ක්‍රියාත්මක වූ පසු ඊට සහභාගී වන උත්පාදකයින් හැර, අනෙකුත් සියලුම උත්පාදනයන් සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් තනි ගැනුම්කරු ලෙස කටයුතු කළ යුතුය.

නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් තමා සමඟ විදුලි අලෙවි ගිවිසුම්වලට එළඹෙන බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි කොට්ඨාස හතර සහ ලංකා විදුලි පුද්ගලික සමාගම) වෙත විදුලිය අලෙවි කළ යුතුය. නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ සම්ප්‍රේෂණ සේවා ගිවිසුමකට එළඹිය යුතුය.

## 2. ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ අරමුණු

මෙම ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ අරමුණු, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ (2025 අංක 14 දරන පනතින් සංශෝධිත) විධිවිධානවලට අනුකූලව පහත පරිදි වේ.

1. නියාමනය කරනු ලබන ආයතන විසින් සපයනු ලබන විදුලිය සහ ඒ ආශ්‍රිත සේවාවන්හි මිල තීරණය කිරීමේදී, පාරිභෝගිකයින්ට දැරිය හැකි බව (Affordability), සාධාරණත්වය (Equity) සහ සමානත්වය (Equality) සහතික කිරීම.
2. නියාමනය කරනු ලබන ආයතනවල ආයෝජන සඳහා සාධාරණ ප්‍රතිලාභයක් ඇතුළුව, මූල්‍යමය තිරසාරභාවය සහතික කිරීම.
3. අයක්‍රම නියම කිරීමේදී නියාමන ආයතනය විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සැපයීම.
4. විවෘත ප්‍රවේශ ගාස්තු නියම කිරීමේදී අනුගමනය කළ යුතු මූලධර්ම නිශ්චිතව දැක්වීම සහ ජාතික විදුලිබල වෙළඳපළ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික පූර්ව අවශ්‍යතාවයන් සැපයීම.
5. සහනාධාර (Subsidies) සහ අන්‍යෝන්‍ය-සහනාධාර (Cross-subsidies) ලබා දීමේදී පදනම් කරගත යුතු මූලධර්ම නිශ්චිතව දැක්වීම.
6. විදුලි සැපයුම් අගය දාමයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ප්‍රවර්ධනය කිරීම සහ ඉල්ලුම් පාර්ශවයේ (Demand Side) බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ප්‍රවර්ධනය කිරීම.

7. තරඟකාරී අයකුම සහ විශ්වාසනීය විදුලිය සැපයුම මගින් පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම. 2025 අංක 14 දරන පනතින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින්, ජාතික විදුලිබල වෙළඳපොළක් පිහිටුවිය යුතු බවට නියම කර ඇත. ජාතික විදුලිබල වෙළඳපොළ ක්‍රමයෙන් ස්ථාපිත කිරීම සඳහා පියවර ගැනීමෙන් අනතුරුව, එම වෙළඳපොළ පරිසරයට ගැළපෙන පරිදි මෙම ජාතික විදුලිබල අයකුම ප්‍රතිපත්තිය යාවත්කාලීන කළ යුතුය.

## 3. ප්‍රතිපත්ති ප්‍රකාශය

විදුලි සැපයුම් ධාරිතාව, විද්‍යුත් බලශක්තිය සහ අනෙකුත් අදාළ සහායක සේවාවන් සැපයීම සඳහා වන පිරිවැය, මිල ගණන් සහ මිල ව්‍යුහය සාමූහිකව “විදුලි අයකුම” ලෙස හඳුන්වනු ලැබේ.

1. අයකුම වලට ඇතුළත් කර ඇති විදුලි උත්පාදන පිරිවැය, තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය කරන ලද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් මත පදනම්ව ආරක්ෂක සීමාවන්ට යටත් ආර්ථික ප්‍රේෂණ මෙහෙයවීම සිදු කරනු ලබන බලාගාරවල පිරිවැය මත පදනම් විය යුතුය.
2. තොග මිලදී ගැනීමේ අයකුම, තොග විකුණුම් අයකුම, සම්ප්‍රේෂණ අයකුම, විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදාහැරීමේ අයකුම සහ සැපයුම් අයකුම පිරිවැය පරාවර්තනය විය යුතු අතර, එමගින් නියාමනය කරනු ලබන ආයතන නියමිත කාර්ය සාධන නිර්ණායක සපුරාලීම යටතේ, ඒවායේ මූල්‍යමය තිරසාරභාවය සහතික කළ යුතුය.
3. ‘ජාතික විදුලිබල වෙළඳපොළ’ ආරම්භ කෙරෙන තුරු, අවසන් පරිභෝජක පාරිභෝගික වර්ගීකරණය, අයකුම සහ අයකුම විකල්ප ඇත්නම් සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා එකම ආකාරයකින් ක්‍රියාත්මක විය යුතුය.
4. ගෘහස්ථ ඒකක සඳහා වන ජීව සහනදායි අයකුම (Lifeline tariffs) සහ අනෙකුත් සහනාධාරිත අයකුම (subsidised tariffs), ඒ සඳහා සුදුසුකම් ලත් පාරිභෝගිකයින් වෙතම ඉලක්කගත කළ යුතුය. සහනාධාර සඳහා මුදල් යෙදවීම අන්‍යෝන්‍ය සහනාධාරවලින් බැහැරව රජයේ අයවැයෙන් සෘජුව ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම දක්වා ක්‍රමයෙන් වෙනස් විය යුතුය.
5. ඉහත (3) සහ (4) ප්‍රතිපත්ති ප්‍රකාශයන්හි සීමාවන්ට යටත්ව, එක් එක් පාරිභෝගික කාණ්ඩය සඳහා පිරිවැය පරාවර්තනය වන අයකුම අදාළ විය යුතුය. අහිතකර ලෙස බලපෑමට ලක්වන, සුදුසු පාරිභෝගිකයින් සඳහා අතුරු සහන ලබා දිය යුතුය.
6. ආර්ථික කටයුතු, පිරිවැය සහ තාක්ෂණික වශයෙන් කාර්යක්ෂම භාවිතය, ඉල්ලුම් කළමනාකරණය සහ සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය වන පරිදි අවසන් පරිභෝජක පාරිභෝගික අයකුම සැකසිය යුතුය.
7. අයකුම තීරණය කිරීමේ ක්‍රියාවලියේ විවික්ත ලක්ෂණ (discrete features) සහ පුනර්ජනනීය බලශක්ති සම්පත්වල සෘතුමය ස්වභාවය හේතුවෙන් මෙන්ම පොසිල ඉන්ධන මිලෙහි විචලනයන් හේතුවෙන් සිදුවන අවසන් පරිභෝජක පාරිභෝගික අයකුම (End-use customer tariffs), උච්චාවචනයන් සමනය කළ යුතුය.
8. අවසන් පරිභෝජක පාරිභෝගික අයකුම දකුණු සහ අග්නිදිග ආසියානු කලාපයේ තරඟකාරී ආර්ථිකයන්හි පවතින අයකුම සමඟ සංසන්දනාත්මකව මිනුම්ගත කිරීම /පිල් ලකුණු කිරීම (Benchmarked) කළ යුතුය.
9. බලපත්‍රලාභීන් ස්වයං-මූල්‍ය පහසුකම් සහිත ආයතන ලෙස මූල්‍යමය වශයෙන් ශක්තිමත් මට්ටමක පවතින බව තහවුරු වන පරිදි අයකුම සකස් කළ යුතුය. මෙම ආයතන ප්‍රමාණවත්ව මූල්‍ය සම්පත් රැස් කරගන්නා තුරු, අත්‍යවශ්‍ය ආයෝජන කටයුතු සඳහා අරමුදල් සපයා ගැනීම සුරක්ෂිත කිරීම සඳහා රජයේ ඇපකර ලබා දීමට කටයුතු කළ යුතුය.

## 4. උපායමාර්ග

සෑම ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සඳහාම උපාය මාර්ග හඳුනාගෙන ඇති අතර ඒවා ජාතික විදුලිබල අයකුම ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ඇතුළත් වේ.

1. අයකුමවලට ඇතුළත් කරඇති විදුලි උත්පාදන පිරිවැය, තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය කරන ලද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් මත පදනම් ව ආරක්ෂක සීමාවන්ට යටත් ආර්ථික ප්‍රේෂණ මෙහෙයවීම සිදු කරනු ලබන බලාගාරවල පිරිවැය මත පදනම් විය යුතුය.

   1.1. “නියමිත දිනයට” පෙරාතුව දැනට ඇති බලාගාර සඳහා සිදු කළ දීර්ඝ කිරීම් ඇතුළත්ව ලංකා විදුලිබල මණ්ඩලය සතුව පැවති සහ ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම වෙත භාර කොට පවරා දෙන ලද විදුලි බලාගාර සඳහා, ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් සමාගම සහ නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම අතර ඇති කරගෙන ඇති විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වලට ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ බැඳීම් ඉටු කිරීමට ප්‍රමාණවත් වන අයකුම ඇතුළත් කළ යුතුය.

   1.2. පොසිල ඉන්ධන මගින් ක්‍රියාත්මක වන දැනට පවතින සියලුම බලාගාර, තරඟකාරී ලෙස ඉන්ධන ප්‍රසම්පාදනය කළ යුතු අතර තාප අනුපාතය සම්බන්ධයෙන් සහතික ලබාගත යුතුය.

   1.3. අලුතින් ප්‍රසම්පාදනය කරනු ලබන සියලුම විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් හෝ සහායක සේවාවල ධාරිතාව, අනුමත කරන ලද දීර්ඝකාලීන විදුලිබල සංවර්ධන සැලැස්මට අනුකූල විය යුතුය.

1.4. මෙගාවොට් 10ට අඩු පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාරවලින් විදුලිය උත්පාදන ප්‍රසම්පාදනය කිරීම, ක්‍රමිකව තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි [5] සමඟ අනුකූලව විය යුතුය.

1.5. අවශෝෂක ගාස්තු අයක්‍රම මත පදනම් වූ දැනට ක්‍රියාත්මක ගිවිසුම් දීර්ඝ කිරීමේදී, අවම පිරිවැය පුනර්ජනනීය බලශක්තියේ ප්‍රතිලාභ දීර්ඝකාලීනව පාරිභෝගිකයන් වෙත ලබා දීම සහතික කිරීම සඳහා ඒවායේ පවතින සුවිශේෂී තත්ත්වයන් සැලකිල්ලට ගත යුතුය.

1.6. පවතින සියලුම විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් සහ සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්, එහි දැක්වෙන තාක්ෂණික සහ වාණිජ පරාමිතීන්ට අනුකූල දැයි පරීක්ෂා කිරීම සඳහා විගණනයක් පවත්වනු ලැබිය යුතුය.

2. තොග මිලදී ගැනීමේ අයක්‍රම, තොග විකුණුම් අයක්‍රම, සම්ප්‍රේෂණ අයක්‍රම, විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදාහැරීමේ අයක්‍රම සහ සැපයුම් අයක්‍රම පිරිවැය පරාවර්තනය විය යුතු අතර, එමගින් නියාමනය කරනු ලබන ආයතන නියමිත කාර්ය සාධන නිර්ණායක සපුරාලීම යටතේ, ඒවායේ මූල්‍යමය තිරසාරභාවය සහතික කළ යුතුය.

2.1. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සිදුකරනු ලබන පද්ධති මෙහෙයුම් සහ තොග විදුලි මිලදී ගැනීම් සඳහා අනුමත ආදායම (Allowed revenue) පිරිවැය පරාවර්තනය වන එකක් විය යුතුය.
2.2 සම්ප්‍රේෂණ අයක්‍රම පිරිවැය පරාවර්තක විය යුතුය.
2.3. සම්ප්‍රේෂණ කාර්යසාධනය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගවිය යුතුය.
2.4. බෙදාහැරීමේ සහ සිල්ලර සේවා අයක්‍රම පිරිවැය පරාවර්තක විය යුතු අතර, එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ ජාලය සඳහා ඒවා වෙන් වෙන් වශයෙන් තීරණය කළ යුතුය.
2.5. බෙදාහැරීමේ කාර්ය සාධනය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගවිය යුතුය.
2.6. සිල්ලර සේවා සැපයීමේ වාණිජමය ගුණාත්මකභාවය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගවිය යුතුය.
2.7. නියාමක විසින් සිදු කරනු ලබන සියලුම ඇගයීම් නීත්‍යානුකූලව සකස් කර ඇති විගණනය කරන ලද නියාමන ගිණුම් මත පදනම් විය යුතුය.

3. ‘ජාතික විදුලිබල වෙළඳපොළ’ ආරම්භ කෙරෙන තුරු, අවසන් පරිභෝජක පාරිභෝගික වර්ගීකරණය, අයක්‍රම සහ අයක්‍රම විකල්ප ඇත්නම් සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා එකම ආකාරයකින් ක්‍රියාත්මක විය යුතුය.

3.1. ‘ජාතික විදුලිබල වෙළඳපොළ’ ආරම්භ කරන තෙක්, දිවයිනේ ඕනෑම ස්ථානයකින් බලපත්‍රලාභියෙකුගේ ජාලයකට සම්බන්ධ වී සිටින පාරිභෝගිකයින් සඳහා පොදු ඒකීය ජාතික අයක්‍රමයක් (Uniform National Tariff - UNT) ක්‍රියාත්මක විය යුතුය.
3.2. අනාගතයේදී විවෘත ප්‍රවේශය ලබා දීමට සූදානම් වීමක් වශයෙන් මධ්‍යම සහ මහා පරිමාණ පාරිභෝගිකයින් සඳහා සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල වෙත ඇති විවෘත ප්‍රවේශය සිතියම්ගත කළ යුතුය.

4. ගෘහස්ථ ඒකක සඳහා වන ජීව සහනදායි අයක්‍රම සහ අනෙකුත් සහනාධාරිත අයක්‍රම, ඒ සඳහා සුදුසුකම් ලත් පාරිභෝගිකයින් වෙතම ඉලක්කගත කළ යුතුය. සහනාධාර සඳහා මුදල් යෙදවීම අන්‍යෝන්‍ය සහනාධාරවලින් බැහැරව රජයේ අයවැයෙන් සෘජුව ප්‍රතිපාදන වෙන්කරවාගැනීම දක්වා ක්‍රමයෙන් වෙනස් විය යුතුය.

4.1. ජීව සහනදායි අයක්‍රම ක්‍රමයෙන් වඩාත් සුදුසු පාරිභෝගිකයින් වෙත ඉලක්කගත කළ යුතුය.
4.2. වීදි සහ පොදු ස්ථාන ආලෝකකරණය කිරීමේ පිරිවැය තවදුරටත් සමාජීයකරණය[6] කළ යුතුය.

5. ඉහත (3) සහ (4) ප්‍රතිපත්ති ප්‍රකාශයන්හි සීමාවන්ට යටත්ව, එක් එක් පාරිභෝගික කාණ්ඩය සඳහා පිරිවැය පරාවර්තනය වන අයක්‍රම අදාළ විය යුතුය. අහිතකර ලෙස බලපෑමට ලක්වන, සුදුසු පාරිභෝගිකයින් සඳහා අතුරු සහන ලබා දිය යුතුය.

5.1. සේවා පිරිවැයෙහි විනිවිදභාවය ඉහළ නැංවිය යුතුය.
5.2. අවසන් පරිභෝජක පාරිභෝගික මිල ව්‍යුහය සරල කළ යුතු අතර, එය ක්‍රමයෙන් පිරිවැය පරාවර්තනය වන, සමානත්වය පිළිබිඹු කරන සහ ජාත්‍යන්තර යහ පුරුදු (International best practices) කරා යොමු වන්නක් විය යුතු අතර ශ්‍රී ලංකාවේ නීති සමඟ අනුකූල විය යුතුය.

6. ආර්ථික කටයුතු, පිරිවැය සහ තාක්ෂණික වශයෙන් කාර්යක්ෂම භාවිතය, ඉල්ලුම් කළමනාකරණය සහ සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය වන පරිදි අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම සැකසිය යුතුය.

6.1 ඉල්ලුම කළමනාකරණය සහ ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ඇත.
6.2. මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ පර්යේෂණ සහ විශ්ලේෂණ කටයුතු ඉහළ නැංවිය යුතුය.

7. අයක්‍රම තීරණය කිරීමේ ක්‍රියාවලියේ පවතින විවික්ත ලක්ෂණ සහ පුනර්ජනනීය බලශක්ති සම්පත්වල ඍතුමය ස්වභාවය හේතුවෙන් මෙන්ම පොසිල ඉන්ධන මිලෙහි විචලනයන් හේතුවෙන් සිදුවන අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රමවල උච්චාවචනයන් සමනය කළ යුතුය.

---

5 2019 අගෝස්තු 09 වන දිනැති *ගැසට්* අංක 2135/61 හි ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවලට අනුකූලව

6 සමාජීයකරණය (Socialised)” යනු, සාමාන්‍යයෙන් විශාල ජනගහනයකට පොදුවේ ප්‍රතිලාභ ලැබෙන සේවාවක් සඳහා අදාළ වන පිරිවැය හෝ ඉන් ලැබෙන ප්‍රතිලාභය සියලුම පාරිභෝගිකයන් අතර බෙදා හැරීමයි.

7.1. තොග සැපයුම් ගනුදෙනු ගිණුම (Bulk Supply Transaction Account ) යනු නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ බලපත්‍රලාභීන් අතර මූල්‍ය ගනුදෙනු කළමනාකරණය කිරීමේ මාධ්‍යය විය යුතු අතර, තොග සැපයුම් ගනුදෙනු (Bulk Supply Transaction) කාලපරිච්ඡේද අතරතුර සිදුවන ඕනෑම මූල්‍ය හිඟයක් නිවැරදි කිරීමට හෝ අතිරික්තයක් අවශෝෂණය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

7.2. පාරිභෝගිකයන්ට සිදුවන අපහසුතාවන් සහ රටේ ව්‍යාපාරික පරිසරය තුළ පවතින අවිනිශ්චිතතාව අවම කිරීම සඳහා, පාරිභෝගික අයක්‍රම නිතර වෙනස් නොවන පරිදි තොග සැපයුම් ගනුදෙනු ගිණුම කළමනාකරණය කළ යුතුය.

8. අවසන් පරිභෝජක අයක්‍රම, දකුණු සහ අග්නිදිග ආසියානු කලාපයේ තරඟකාරී ආර්ථිකයන්හි පවතින අයක්‍රම සමඟ සංසන්දනාත්මකව මිනුම්ගත කිරීම/ පිල් ලකුණු කිරීම කළ යුතුය.

8.1.කලාපයේ අනෙකුත් රටවල අයක්‍රම සමඟ ශ්‍රී ලංකාවේ අයක්‍රම සංසන්දනාත්මකව මිනුම්ගත කිරීම/ පිල් ලකුණු කිරීම කළ යුතුය.

8.2. විදුලි මිල ගණන්වල අනාගත දිශානතිය විනිවිදභාවයකින් යුතුව ගණනය කර ප්‍රකාශයට පත් කළ යුතුය.

9. බලපත්‍රලාභීන් ස්වයං-මූල්‍ය පහසුකම් සහිත ආයතන ලෙස මූල්‍යමය වශයෙන් ශක්තිමත් මට්ටමක පවතින බව තහවුරු වන පරිදි අයක්‍රම සකස් කළ යුතුය.

## 5. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව

2024 අංක 36 දරන විදුලිබල පනතේ 4 (10) (v) වගන්තිය ප්‍රකාරව, මෙම ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට ලිඛිතව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකිය. මෙම පසුබිම තුළ, පහත දැක්වෙන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව මගින් එක් එක් ප්‍රතිපත්ති ප්‍රකාශය සහ ඒ යටතේ ඇති උපාය මාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා නියාමක, නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ අනෙකුත් බලපත්‍රලාභීන් විසින් ගත යුතු විශේෂිත ක්‍රියාමාර්ග දක්වා ඇත.

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව බලාත්මක වී වසරක් ඇතුළත අදාළ ආයතන විසින් අදාළ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සහ අවසන් කිරීම සිදු කරනු ලැබිය යුතුය.

### 5.1. අයක්‍රම ක්‍රමවේදය සකස් කිරීමේදී නියාමක විසින් අනුගමනය කළ යුතු පොදු මූලධර්ම

පනතෙ හි "අයක්‍රම ක්‍රමවේදය" (Tariff Methodology) පිළිබඳව පැහැදිලිව සඳහනක් නොමැත. විනිවිදභාවය සහ වගවීම අරමුණු කරගත් අයක්‍රම ක්‍රමවේදයක අවශ්‍යතාව මෙම ප්‍රතිපත්තිය මගින් හඳුනාගෙන ඇත.

අයක්‍රම ක්‍රමවේදයට ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රධාන අංග දෙකක් ඇතුළත් වේ (i) එක් එක් බලපත්‍රලාභියාගේ අවසරලත් ආදායම්, තොග සැපයුම් ගාස්තු, මුළු සැපයුම් පිරිවැය සහ බලපත්‍රලාභීන් අතර හුවමාරු මිල ගණන් තීරණය කිරීමේ ක්‍රමවේදය (ii) එක් එක් අවසන් පරිභෝජක පාරිභෝගික කාණ්ඩයට සැපයුම් පිරිවැය (සම්ප්‍රේෂණය මගින් සේවය කරන පාරිභෝගිකයින් ඇතුළුව), එක් එක් කාණ්ඩය සහ උප කාණ්ඩය සඳහා පාරිභෝගික අයක්‍රමවල එක් එක් සංරචකයේ පිරිවැය හා මිල ගණනය කිරීම, සහනාධාර හෝ අන්‍යෝන්‍ය සහනාධාර ගණනය කිරීම සහ බලපත්‍රලාභී ආයතනවල මුළු ආදායම තීරණය කිරීමේ ක්‍රමවේදය.

අයක්‍රම ක්‍රමවේදයක් යහකස් කිරීම සඳහා නියාමක විසින් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ (සංශෝධිත) විධිවිධානවලට අනුකූල ජාත්‍යන්තර යහ පිළිවෙත් අනුගමනය කළ යුතුය. මෙම ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ උපායමාර්ග සහ නිශ්චිත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා, අයක්‍රම ක්‍රමවේදයේ (i) කොටස පහත ලැයිස්තුගතකර ඇති පොදු මූලධර්ම අනුගමනය කළ යුතු අතර, අයක්‍රම ක්‍රමවේදයේ (ii) කොටස අදාළ අංශවල දක්වා ඇති නිශ්චිත විධිවිධාන අනුගමනය කළ යුතුය.

1. නියාමක විසින් බහු වසර අයක්‍රම කාලසීමාව තීරණය කර ප්‍රකාශයට පත් කළ යුතුය. මෙම කාලසීමාව සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට මෙන්ම නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ද සමාන විය යුතුය.

2. උත්පාදන බලාගාරවල ධාරිතා සහ බලශක්ති පිරිවැය අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් සහ සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් හෝ සම්බන්ධක ගිවිසුම්වල (Connection agreements) සඳහන් පරිදි විය යුතුය. ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් පවරා ගන්නා උත්පාදන බලාගාර සඳහා, ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ආරම්භක වසර 3 සඳහා වන බහු වසර අයක්‍රම මත පදනම් වූ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්හි ධාරිතා පිරිවැය නියාමකගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි බලාගාර සඳහා ඉදිරිපත් කරන ධාරිතා පිරිවැය මගින් පවරා දුන් වත්කම්වල ණය බැඳීම්, (මූලික හා පොලී ඇතිනම්), පවරා දුන් සහ නව වත්කම්වල ස්ථාවර මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය, නව වත්කම්වල කොටස් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ (කාර්යක්ෂමතාව හෝ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා වන ඒවා ඇතුළුව), ලං.වි.ම, ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පවරන ලද වත්කම් වල වත්කම් මත ප්‍රතිලාභ, කාරක ප්‍රාග්ධනය සඳහා වන පොලිය, ආයතනික පිරිවැය, රක්ෂණ සහ අදාළ බදු පියවා ගත යුතුය. ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පවරා දුන් උත්පාදන වත්කම් සඳහා වත්කම් මත ප්‍රතිලාභය වසරකට 2% ක් විය යුතුය.

4. සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අයක්‍රමවලට ක්ෂයවීම්, පොලිය, මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය, අදාළ කිසියම් වූ බදු, මෙහෙයුම් ප්‍රාග්ධනය සඳහා වන පොලිය, ආයතනික පිරිවැය, රක්ෂණය, නව වත්කම්වල කොටස් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ (කාර්යක්ෂමතාව හෝ විශ්වසනියත්වය වැඩි දියුණු කිරීම සඳහා වන ඒවා ඇතුළුව) සහ ලං.වි.ම. මගින් පවරන ලද වත්කම්වල වත්කම් මත ප්‍රතිලාභ යන අනුමත පිරිවැය ඇතුළත් විය යුතුය. ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් පවරා දුන් වත්කම් සඳහා වසරකට 2% ක වත්කම් මත ප්‍රතිලාභයක් අදාළ වේ.

5. ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් හි නව වත්කම්, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ වත්කම් (නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් තරඟකාරී ප්‍රසම්පාදනය හරහා පවරනු ලැබූ ඒවා හැර) සඳහා අනුමත කෙරෙන කොටස් ප්‍රාග්ධන මත ප්‍රතිලාභය තීරණය කිරීමේදී, නියාමක විසින් බලපත්‍රලාභියාගේ ව්‍යාපාරයේ ණය සහ ප්‍රාග්ධන අනුපාතය, ණය පිරිවැය, කොටස් පිරිවැය හා කිසියම් වෙනත් අදාළ සාධක මෙන්ම ක්‍රම ක්‍රමයෙන් අවසන් පරිභෝජක පාරිභෝගිකයින් වෙත අවම අයක්‍රම සලසා දීමේ ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අවම පාරිභෝගික අයක්‍රම පවත්වාගෙන යාමේ පුළුල් අරමුණ කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

6. ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් පවරා දුන් වත්කම් මත ලැබෙන මෙම ප්‍රතිපත්තිය මඟින් නියම කළ 2% ක ප්‍රතිලාභයේ ප්‍රමාණවත්භාවය පිළිබඳව ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය අනුමත කර වසරක් ඇතුළත නියාමක විසින් විධිමත් අධ්‍යයනයක් කළ යුතුය. වත්කම් මත ප්‍රතිලාභ ගණනය කිරීමේ පදනම් සහ අනුපාතය පිළිබඳ ඕනෑම සංශෝධනයක් ඇත්නම් නියාමක විසින් බලශක්ති අමාත්‍ය වරයාට ප්‍රතිපත්තිමය උපදෙසක් ලබා දිය යුත අතර, එය අනුමත කර ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් ලෙස නිකුත් කරනු ලැබිය යුතුය.

7. ක්ෂයවීම් අදාළ වන අවස්ථාවලදී, එය අවශේෂ අගයකින් තොරව, ව්‍යවස්ථාපිත ගිණුම් සඳහා භාවිත කරන සේවා කාලයම යොදා ගනිමින් සරල රේඛීය ක්‍රමවේදය මත පදනම් විය යුතුය.

8. නව වත්කම් සම්බන්ධයෙන්, ණය සඳහා ගෙවිය යුතු මූලික මුදල ක්ෂයවීම් ප්‍රතිපාදනයට වඩා සැලකිය යුතු ලෙස වැඩි වන අවස්ථාවලදී, අයක්‍රම නිර්ණය කිරීමේ අරමුණින් වේගවත් ක්ෂයවීම් (Accelerated depreciation) සඳහා සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට මෙන්ම නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් හට ද නියාමකගෙන් ඉල්ලීමක් කළ හැකිය.

9. ප්‍රාග්ධන ප්‍රදාන ඇත්නම් සහ වෙනත් පාර්ශවයක් (පාරිභෝගිකයන් ඇතුළුව) ආයෝජනය කරන ලද වත්කම් සඳහා කිසිදු ක්ෂයවීමක්, පොලියක් හෝ කොටස් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභයක් ලබා නොදිය යුතුය. එවැනි වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන ප්‍රාග්ධන පාරිශ්‍රමිකයන් (Capital remuneration) වෙනත් ඕනෑම නව ආයෝජනයක් ලෙස සලකනු ලැබේ.

10. අයක්‍රම අරමුණු සඳහා, නියාමන වත්කම් පදනම (Regulatory asset base) තීරණය කිරීම සඳහා සහ අලුතින් එක් කළ වත්කම්, ඉවත් කළ වත්කම්, ඉදිකිරීම් කාලය තුළ පොලී ප්‍රතිපාදන සහ විනිමය අනුපාතික විචලනයන් සම්බන්ධයෙන් නියාමක විසින් පැහැදිලි මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය.

11. අනුමත පොලී පිරිවැය (Allowed interest costs) බලපත්‍රලාභියාගේ ඉදිරිපත් කිරීම් මත පදනම් විය යුතු අතර, වාණිජ ප්‍රභවයන්ගෙන් ණය ලබා ගන්නේ නම්, බලපත්‍රලාභියා හැකි උපරිම කොන්දේසි යටතේ ණය ලබාගෙන ඇති බවට නියාමක සෑහීමකට පත් විය යුතුය. නියාමක විසින් මේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් නිකුත් කළ යුතුය.

12. රක්ෂණ වැනි අනෙකුත් අනුමත ස්ථාවර පිරිවැය, ඉදිරිපත් කරන ලද සැබෑ වියදම් මත පදනම් විය යුතුය. සෑම සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකු විසින්ම රක්ෂණ අරමුදලක් පිහිටුවිය යුතුය. රක්ෂණ අරමුදල කළමනාකරණය කිරීම සඳහා නියාමක විසින් මාර්ගෝපදේශ සකස් කළ යුතුය.

13. අනුමත මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය බලපත්‍රලාභියාගේ වඩාත්ම මෑතකාලීන විගණනය කරන ලද නියාමන ගිණුම් මත පදනම් විය යුතුය. අනුමත මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය පාරිභෝගික මිල දර්ශකයට (CPI) අනුව සංශෝධනය කළ යුතුය. අනුමත මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය නැවත අයකර නොගත යුතුය.

14. වත්කම් මත ප්‍රතිලාභ හෝ කොටස් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ මඟින් උපයන ආදායම අනාගත ආයෝජන සඳහා පමණක් භාවිතා කිරීමට බලපත්‍රලාභියා සතුව රඳවා ගත යුතුය. එසේ රඳවාගත් මුදල් ආයෝජනය නොකරන්නේ නම්, එම මුදල් අවසාන පාරිභෝජක පාරිභෝගික අයක්‍රම අඩු කිරීම සඳහා යොමු කළ යුතුද යන්න කොටස් හිමියා විසින් තීරණය කළ යුතුය.

15. මූල්‍ය වර්ෂය අවසන් වී මාස 6ක් ඇතුළත විගණනය කරන ලද ගිණුම් නියාමක වෙත ලබා දීම සෑම බලපත්‍රලාභියෙකුටම අනිවාර්ය වේ.

16. අයක්‍රම ඉදිරිපත් කිරීමේ ආකෘති (Tariff filing formats), ඉදිරිපත් කරන අවස්ථාවේ ක්‍රියාත්මක වන බහු වසර අයක්‍රම කාලසීමාවට ගැළපෙන පරිදි සහ නව කර්මාන්ත ව්‍යුහය සමඟ අනුකූල වන පරිදි නියාමක විසින් ලබා දිය යුතුය.

17. බේරුම්කරණ තීන්දු (Arbitration awards) සහ බේරුම්කරණ පිරිවැය (Arbitration costs), අධිකරණ තීන්දු සහ නීති කටයුතු පිරිවැය, මෙන්ම පාලනය කළ නොහැකි තත්ත්වයන් මත ඇති වන සිදුවීම් (Force majeure) හේතුවෙන් විදුලි උත්පාදන බලාගාර හෝ බලශක්තිය ලබා ගැනීම සිදුවීම යන රක්ෂණයෙන් ආවරණය නොවන අමතර පිරිවැය යනාදී සිය පාලනයෙන් බැහැරව සිදුවන්නා වූ සහ ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ වෙනත් කිසිදු ප්‍රතිපාදනයකින් ආවරණය නොවන්නා වූ අසාමාන්‍ය සිදුවීම් (Extraordinary events) මත ඇතිවන මුදල් පිටතට ගලායාම් හානිපූරණය කරගැනීම සඳහා හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභීන්ට හැකිය.

මෙම ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය හා සමගාමීව නියාමක විසින් ප්‍රකාශයට පත් කරන ලද අයක්‍රම ක්‍රමවේදයට නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ අනෙකුත් බලපත්‍රලාභීන් අනුකූල විය යුතුය. සෑම බලපත්‍රලාභියෙකුම සිය අනුමත සංවර්ධන සැලසුම් පදනම් කරගෙන පිරිවැය ඉදිරිපත් කළ යුතු අතර, නියාමක විසින් දැනුම් දෙනු ලබන අවස්ථාවකදී අයක්‍රම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

**5.2. ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ රාමුව**

1. අයක්‍රම සඳහා ඇතුළත් කරනු ලබන උත්පාදන පිරිවැය, තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය කරන ලද විදුලි මිලදී ගැනීමේ ගිවිසුම් මත පදනම් වූ පිරිවැය සහිත, ආරක්ෂණ සීමාවන්ට යටත් වූ ආර්ථිකමය විදුලි ප්‍රේෂණ මෙහෙයවීම් ක්‍රමවේදය මත පදනම් විය යුතුය.

1.1. “නියමිත දිනයට” පෙරාතුව දැනට ඇති බලාගාර සඳහා සිදු කළ දීර්ඝ කිරීම් ඇතුළත්ව ලංකා විදුලිබල මණ්ඩලය සතුව පැවති සහ ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත භාර කොට පවරා දෙන ලද විදුලි බලාගාර සඳහා, ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සහ නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර ඇති කරගෙන ඇති විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වලට ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්හි බැඳීම් ඉටු කිරීමට ප්‍රමාණවත් වන අයක්‍රම ඇතුළත් කළ යුතුය.

අ) බලාගාරවල ප්‍රධාන අලුත්වැඩියාවන්, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපනය, ප්‍රතිබලගැන්වීම (Repowering), ඉන්ධන ප්‍රභවය මාරු කිරීම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සේවා කාලය දීර්ඝ කිරීම සඳහා වන ආයෝජන වෙනුවෙන් දීර්ඝකාලීන විදුලි පද්ධති සංවර්ධන සැලැස්මට අනුකූලව වෙනම නියාමන ඉදිරිපත් කිරීමක් (Regulatory filing) කළ යුතු අතර, ඒවා ක්‍රියාත්මක කිරීමෙන් පසු එම ආයෝජන සඳහා ක්ෂයවීම්, පොලී පිරිවැය, මෙහෙයුම් සහ නඩත්තු (O&M) පිරිවැය සහ කොටස් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභයක් ලබා දිය යුතුය.

ආ) මූල්‍යමය වශයෙන් වාසිදායක කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ පියවර සහ ආයෝජන හඳුනා ගැනීම සඳහා, ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්හි ඕනෑම තාක්ෂණයක සියලුම බලාගාර අනිවාර්ය බලශක්ති විගණනයක් සිදු කළ යුතු අතර, එම විගණනය ජාත්‍යන්තර යහ පුරුදු වලට අනුකූල විය යුතුය. නියාමක අනුමැතිය ලැබීමෙන් පසු, එවැනි ආයෝජන බහු වසර අයක්‍රම සඳහා හෝ ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් ඉදිරිපත් කරන විශේෂිත ඉදිරිපත් කිරීමක් සඳහා ඇතුළත් කළ යුතුය.

ඇ) ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම පිරිවැය සවිස්තරාත්මක මූල්‍ය විගණනයකට යටත් කළ යුතු අතර එහි සොයා ගැනීම් ප්‍රසිද්ධ කළ යුතුය.

1.2. පොසිල ඉන්ධන මගින් ක්‍රියාත්මක වන දැනට පවතින සියලුම බලාගාර, තරඟකාරී ලෙස ඉන්ධන ප්‍රසම්පාදනය කළ යුතු අතර තාප අනුපාතය පිළිබඳ සහතික ලබාගත යුතුය.

අ) ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සතු දැනට පවතින සියලුම තාප බලාගාර, මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී වසර දෙකක් ඇතුළත, මිල ගණන් තරඟකාරී ලෙස තීරණය වන බව සහතික කරමින්, ඉන්ධන සැපයුම්කරුවන් එක් අයෙකු හෝ කිහිප දෙනෙකු සමඟ ඉන්ධන සැපයුම් ගිවිසුම්වලට එළඹිය යුතුය.

ආ) ස්වාධීන විදුලි නිෂ්පාදකයින්ගේ සියලුම ඉන්ධන සැපයුම් ගිවිසුම් ද තරඟකාරී ලෙස මිල තීරණය වී ඇත්දැයි සහතික කිරීම සඳහා සංචිතවල අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් නියාමක විසින් සමාලෝචනය කළ යුතුය.

ඇ) මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී වසර දෙකක් ඇතුළත නියාමක විසින් ස්වාධීන පාර්ශවයක් මගින් සියළුම තාප බලාගාරවල තාප අනුපාතය තහවුරු කර ගැනීම සහතික කිරීමට කටයුතු කළ යුතුය.

1.3 ප්‍රසම්පාදනය කරනු ලබන සියලුම නව විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් හෝ සහායක සේවාවල ධාරිතාව, අනුමත කරන ලද දීර්ඝකාලීන විදුලිබල සංවර්ධන සැලැස්මට අනුකූල විය යුතුය.

අ) ඕනෑම වර්ෂයක අලුතින් ප්‍රසම්පාදනය කරනු ලබන උත්පාදන ධාරිතාව (වෙන් වෙන් වශයෙන් සහ සමුච්චිතව), අනුමත උත්පාදන ව්‍යාප්ති සැලැස්මෙහි (අනුමත දීර්ඝකාලීන විදුලිබල සංවර්ධන සැලැස්මෙහි කොටසක් වන) එම වර්ෂය සඳහා දක්වා ඇති ධාරිතාවන් මත පදනම් විය යුතු අතර එම සීමාවන්ට යටත් විය යුතුය. ඕනෑම අවස්ථාවක පවතින අනුමත සැලැස්ම, දැනට ක්‍රියාත්මක වන ධාරිතාව සහ දැනට සිදුවෙමින් පවතින අනුමත ධාරිතා සංවර්ධන

කටයුතු මෙන්ම සැබෑ ඉල්ලුමෙහි වර්ධනය සැලකිල්ලට ගනිමින්, තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් හෝ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් අත්සන් කරනු ලැබිය හැකි නව ගිවිසුම්වල ධාරිතා සීමාවන් පිළිබඳව නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කාර්තුමය නිවේදනයක් නිකුත් කළ යුතුය. මෙය 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙහි (2025 අංක 14 දරන පනතින් සංශෝධිත) දක්වා ඇති ධාරිතා සීමාවන්ට සහ එම පනත්වලට අනුකූලව බලශක්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන ඕනෑම ප්‍රතිපත්ති මාර්ගෝපදේශයකට යටත් විය යුතුය.

ආ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කාර්තුමය පදනමින් නියාමක වෙත තොරතුරු සැපයිය යුතු අතර, ප්‍රේෂණය කළ නොහැකි (non-dispatchable) එක් එක් වර්ගයේ විදුලි බලාගාරවල පද්ධති ස්ථායිකරන යාන්ත්‍රණයන් සහ ඕනෑම වර්ගයේ විදුලි බලාගාරයක පිරිවැය කාර්යක්ෂම නොවන නුසුදුසු මෙහෙයුම් ක්‍රියාකාරීත්වය (out-of-merit operation) හේතුවෙන්, විකුණුම්කරුවන් හට මූල්‍යමය පාඩු සිදුව ඇත්නම් ඒවා ද, තනි ගැනුම්කරු ලෙස නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් හට මූල්‍යමය අලාභ/ අතිරේක වියදම් සිදුව ඇත්නම් ඒවා ද සමාලෝචනය කර ප්‍රකාශයට පත් කිරීමට නියාමක විසින් කටයුතු කළ යුතුය. ඉදිරි කාල පරිච්ඡේද තුළදී ප්‍රේෂණය කළ නොහැකි බලාගාරවල පද්ධති ස්ථායිතාව වැඩි දියුණු කිරීම සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මෙම තොරතුරු උපයෝගී කර ගනු ලැබිය යුතුය.

ඇ) පද්ධති ස්ථායිතාව සහතික කිරීම මගින් විශ්වසනීය බලශක්ති පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා වූ නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සතු වන කාර්යභාරය, දැනට ක්‍රියාත්මක කොන්ත්‍රාත්තු සහ අදාළ නීතිවල නියමයන්ට යටත්ව, නිෂ්පාදක පාරිභෝගිකයින් (prosumers) සමඟ හවුලේ සිදු කළ යුතුය.

ඈ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කැඳවනු ලබන විවෘත තරඟකාරී ලංසු, සියලුම තාප බලාගාර සඳහා වන නව විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ප්‍රසම්පාදනය කිරීමේ පදනම විය යුතුය. එහි අයක්‍රම යෝජනාව මූලික වශයෙන් ස්ථාවර පිරිවැය (Fixed costs) සහ විචල්‍ය පිරිවැය (Variable costs) ලෙස කොටස් දෙකකින් සමන්විත විය යුතුය.

1.4. මෙගාවොට් 10ට අඩු පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාරවලින් විදුලිය උත්පාදනය ප්‍රසම්පාදනය කිරීම, ක්‍රමයෙන් තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සමඟ අනුගත විය යුතුය.

අ) ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, කුඩා ජල විදුලි, සූර්ය පැනල සහ සුළං බලය වැනි තාක්ෂණයන්, විදුලි පාරිභෝගිකයන් විසින් ගෙවන ලද, ආයෝජකයින් වෙත මින් පෙර සලසන ලද දිරිගැන්වීම්වල ප්‍රතිඵලයක් ලෙස මේ වන විට පරිණතභාවයට පත්ව ඇති පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් ලෙස පිළිගැනේ. ජෛව ස්කන්ධ සහ අපද්‍රව්‍යයෙන් බලශක්තිය නිපදවීම වැනි අනෙකුත් තාක්ෂණයන් වරින් වර සමාලෝචනය කිරීමට සහ ඒවා සඳහා අඛණ්ඩ දිරිගැන්වීම් ලබා දීමට අවශ්‍ය විය හැකිය.

ආ) පරිණත පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් තරඟකාරී නොවන ලෙස ප්‍රසම්පාදනය කිරීම සඳහා පවතින මෙගාවොට් 10 ක ධාරිතා සීමාව, එක් එක් තාක්ෂණයට ආවේණික වූ අඩු ධාරිතා සීමාවක් දක්වා සංශෝධනය කිරීමේ අරමුණින් බලශක්ති අමාත්‍යවරයා විසින් සමාලෝචනය කරනු ඇත.

ඇ) නියාමක විසින් තීරණය කරනු ලබන අවශෝෂක ගාස්තු අයක්‍රම පිරිවැය පරාවර්තක සහ එක් එක් තාක්ෂණයට විශේෂිත ඒවා විය යුතු අතර, අවම වශයෙන් මාස හයකට වරක්වත් ඒවා සංශෝධනය කළ යුතුය. මෙම ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් මාස 6ක් ඇතුළත, අවශෝෂක ගාස්තු අයක්‍රම ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදය පැහැදිලි කරමින් තාක්ෂණික සටහනක් සකස් කර බලශක්ති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට නියාමක විසින් කටයුතු කළ යුතුය.

ඈ) වහල මත සවිකරන සූර්ය පැනල සබඳතා ගිවිසුම්වල සහ සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වල කාලසීමාව පරිණත පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් සඳහා වසර 12 ක් නොඉක්මවිය යුතු අතර, වෙනත් කිසිදු තාක්ෂණයක් සඳහා වසර 20 ක් නොඉක්මවිය යුතුය. බලාගාරයේ ආයු කාලය සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් කාලයට වඩා වැඩි තාක්ෂණයන් සඳහා, අවශෝෂක අයක්‍රම ගණනය කිරීමේදී බලාගාරයේ ආර්ථික ආයු කාලය මත පදනම් වූ සරල රේඛීය ක්ෂයවීම් අනුව අවශේෂ අගය (Salvage value) තීරණය කළ යුතුය.

ඉ) වහල මත සවිකරන සූර්ය පැනල ඒකක මගින් ලබාදෙන ධාරිතාව සහ බලශක්තිය අර්ථවත් ලෙස මැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා, මෙම ප්‍රතිපත්තිය බලාත්මක වූ දින සිට ජාලගත සූර්ය බලශක්ති උත්පාදන පහසුකම් සඳහා වන සියලුම නව ගිවිසුම් ''නෙට් ප්ලස්'' පදනම මත විය යුතුය. පවතින ජාලගත සූර්ය බලශක්ති පද්ධති සඳහා වන ඕනෑම කාලසීමාව දීර්ඝ කිරීමක් අවශ්‍ය නම් එය ද ''නෙට් ප්ලස්'' පදනම මතම විය යුතුය. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව බලාත්මක වන දින සිට එවැනි සියලුම පද්ධති සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට දුරස්ථව ප්‍රවේශ විය හැකි සුහුරු මනු ඇතුළත් විය යුතුය. වහළ මත සවිකරන සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනයන් ජාල කේත සංග්‍රහයෙහි දක්වා ඇති ව්‍යවස්ථාපිත තාක්ෂණික රෙගුලාසි උල්ලංඝනය නොකළ යුතුය.

ඊ) වහල මත සවිකරන සූර්ය බලශක්ති සහ අනෙකුත් පරිණත පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් තරඟකාරී අයක්‍රම යටතේ ප්‍රසම්පාදනය කිරීම සඳහා බලශක්ති ඒකාබද්ධ කරන්නන් හෝ ප්‍රජා බලශක්ති සමුපකාර වැනි නව්‍ය ව්‍යාපාරික ආකෘති හරහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සමඟ එක්ව නියමු තරඟකාරී ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුය. පරිණත පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්ගෙන් දැනට පවතින ගිවිසුම් දීර්ඝ කිරීම සඳහා අවශෝෂක ගාස්තු අයක්‍රම තීරණය කිරීමට වෙළඳපොල මිල හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ලෙස මෙම ක්‍රියාවලිය පුළුල් කළ යුතු ය.

උ) බැටරි බලශක්ති ගබඩා පද්ධති සඳහා වන අවශෝෂක ගාස්තු අයක්‍රම සහ අදාළ ගිවිසුම්ගත කොන්දේසි මගින්, ප්‍රාථමික බලශක්ති ප්‍රභවය ලෙස සූර්ය බලශක්ති ඒකක මගින් ආරෝපණය කිරීම දිරි ගැන්විය යුතු අතර අනෙකුත් ප්‍රාථමික බලශක්ති ප්‍රභවයන්ගෙන් ආරෝපණය කිරීම දිරිමත් නොකළ යුතුය. බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් නිර්ණය කරනු ලබන පරිදි බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුගේ ජාලයක් භාවිතයෙන් බැටරි ආරෝපණය කිරීමට අවසර දෙනු ලැබිය යුතුය. බෙදාහැරීමේ බලපත්‍රභියෙකුගේ ජාලයක් භාවිතයෙන් බැටරි ආරෝපණය කිරීමට නම් මෙම ප්‍රතිපත්තියේ දක්වා ඇති පරිදි පිරිවැය පරාවර්තක වූ භාවිත කාලය පදනම් කරගත් අයක්‍රමයක් ගෙවීමට යටත්ව එම ආරෝපණය සඳහා අවසර දෙනු ලැබිය යුතුය. බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ගිවිසුම්ගත විය යුතු එවැනි සම්පත්වල ධාරිතා සීමාවන් පිළිබඳව නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතුය. මෙම ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් මාස තුනක් ඇතුළත අදාළ ගාස්තු ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය. මෙම ගාස්තුව ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ඕනෑම ප්‍රමාදයක් හේතුවෙන් සිදුවන ඕනෑම ආර්ථික අලාභයක් අදාළ පාර්ශවයන් විසින් විඳ දරාගත යුතුය. සියලුම වර්ගයේ පාරිභෝගිකයින් සහ නිෂ්පාදක පාරිභෝගිකයින් සඳහා වන ස්ථාවර ගාස්තු සහ බලශක්ති ගාස්තු එක් එක් භාවිත කරන වේලා (Time of Use) පරාසයන්හි සැපයුම් පිරිවැය සමඟ සම්පූර්ණයෙන්ම අනුගත වන බැවින්, ගිවිසුම්ගත කොන්දේසිවල විශේෂ සීමාවන් සහ ප්‍රතිපාදන අවශ්‍ය නොවනු ඇත.

1.5. අවශෝෂක අයක්‍රම මත පදනම් වූ දැනට ක්‍රියාත්මක ගිවිසුම් දීර්ඝ කිරීමේදී, අඩු පිරිවැය පුනර්ජනනීය බලශක්තියේ ප්‍රතිලාභ දීර්ඝකාලීනව අවසන් පරිභෝජක පාරිභෝගිකයන් වෙත ලබා දීම සහතික කිරීම සඳහා ඒවායේ පවතින සුවිශේෂී තත්ත්වයන් සැලකිල්ලට ගත යුතුය.

අ) ත්‍රිත්ව ස්ථර අයක්‍රමය (Three-tier tariff) අදාළ වූ අවශෝෂක අයක්‍රම මත පදනම් වන සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීමේදී, එම ගිවිසුම් කාලයෙහි අවසාන වසරේ පැවති අයක්‍රමය මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සඳහා ලබා දී ඇති වාර්ෂික ඉහළ නැංවීම් ඇතුළුව අදාළ විය යුතුය. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එවැනි තොරතුරු නියාමක වෙත දැනුම් දිය යුතුය.

ආ) අවශෝෂක ගාස්තු අයක්‍රම යටතේ පවතින වහල මත සවිකරන ජාලගත සූර්ය බලශක්ති උත්පාදන පහසුකම් සඳහා වන ගිවිසුම් දීර්ඝ කිරීම, සූර්ය බලශක්ති උත්පාදනය සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන වෙළඳපොළ මිල පදනම මත සිදු කළ යුතුය. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එම තොරතුරු නියාමක වෙත දැනුම් දිය යුතුය.

ඇ) අනෙකුත් සියලුම සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම, එක් එක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයෙන් නිපදවන විදුලිය සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන වෙළඳපොළ මිල පදනම මත සිදු කළ යුතුය. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එම තොරතුරු නියාමක වෙත දැනුම් දිය යුතුය.

ඉ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් තාක්ෂණය මත පදනම්ව දීර්ඝ කිරීමේ කාල සීමාව නිර්ණය කළ යුතුය. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එවැනි තොරතුරු නියාමක වෙත දැනුම් දෙනු ලැබිය යුතුය.

1.6. පවතින සියලුම විදුලි මිලදී ගැනීමේ ගිවිසුම් සහ සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්, තාක්ෂණික සහ වාණිජ පරාමිතීන්ට අනුකූල දැයි පරීක්ෂා කිරීම සඳහා විගණනයක් පවත්වනු ලැබිය යුතුය.

අ) මෙගාවොට් 5 හෝ ඊට වැඩි පුනර්ජනනීය බලශක්ති බලාගාර සඳහා වන සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ඇතුළුව, දැනට ක්‍රියාත්මක සියලුම විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් සඳහා විගණනයක් සිදු කළ යුතු අතර මෙහිදී මූලික වශයෙන් බලාගාර නඩත්තුව සහ මෙහෙයුම් ඇතුළුව දෙපාර්ශවයේම වගකීම් කොතෙක් දුරට ඉටු කර ඇත්දැයි පරීක්ෂා කළ යුතුය.

ආ) සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් සහ වහළ මත සවි කරන සූර්ය බලශක්ති පද්ධති සම්බන්ධතා සඳහා වන ගිවිසුම් ඇතුළුව දැනට පවතින විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් වල යම් අසාධාරණ කොන්දේසි පවතී නම්, ජාතික ආර්ථිකයට ප්‍රතිලාභ සැලසෙන පරිදි එම කොන්දේසි සංශෝධනය කිරීම සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ බලපත්‍රලාභියා අතර නැවත සම්මුති සාකච්ඡා ආරම්භ කිරීමට නියාමක කටයුතු කළ යුතුය.

2. නියාමනය කරනු ලබන ආයතන නියමිත කාර්ය සාධන නිර්ණායක සපුරාලීමට යටත්ව, එම ආයතනවල මූල්‍යමය තිරසාරභාවය තහවුරු කිරීම සඳහා තොග මිලදී ගැනීමේ අයක්‍රමය, තොග විකුණුම් අයක්‍රම, සම්ප්‍රේෂණ අයක්‍රම, විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදාහැරීමේ අයක්‍රම සහ සැපයුම් අයක්‍රම පිරිවැය පරාවර්තනය විය යුතුය.

2.1. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සිදුකරනු ලබන පද්ධති මෙහෙයුම් සහ තොග විදුලි මිලදී ගැනීම් සඳහා අනුමත ආදායම පිරිවැය පරාවර්තනය විය යුතුය.

අ) පද්ධති මෙහෙයුම් සඳහා වන අනුමත ආදායමට ඇතුළත් විය යුත්තේ වත්කම් ක්ෂයවීම්, පොලී පිරිවැය සහ කාර්ය මණ්ඩල හා නඩත්තු වියදම් ඇතුළත් විය හැකි ස්ථාවර පිරිවැය පමණි.

ආ) තොග විදුලි මිලදී ගැනීමේ පිරිවැය ඉදිරිපත් කිරීමට සකස් කිරීමේ දී, පුරෝකථනය කරන ලද ඉල්ලුම සපුරාලීම, බහුවිධ පරිශීලකයින් සඳහා ජල විදුලි පහසුකම් මෙහෙයවීම සහ අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හා ගබඩා පහසුකම්වල දායකත්වය ආකෘතිගත කිරීම සඳහා නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් බලාගාරවල මෙහෙයුම් ආකෘතිකරණ ක්‍රියාත්මක කිරීමේ දී ජාත්‍යන්තර යහ පුරුදු අනුගමනය කළ යුතුය.

ඇ) ස්වාධීන ඇගයීමකට ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් විස්තර සහිතව, එම ආකෘතිකරණ දත්ත සහ ප්‍රතිඵල නියාමක වෙත ලබා දිය යුතු අතර ප්‍රසිද්ධියේ හෙළි කළ යුතුය.

2.2. සම්ප්‍රේෂණ අයක්‍රම පිරිවැය පරාවර්තක විය යුතුය.

අ) සම්ප්‍රේෂණ වෝල්ටීයතා මට්ටමින් සේවා ලබා ගන්නා අවසන් පරිභෝජක පාරිභෝගිකයන් සඳහා වන අයක්‍රම පිරිවැය පරාවර්තක විය යුතුය. එවැනි පාරිභෝගිකයන් සම්බන්ධයෙන් නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සේවා සපයන්නා ලෙස කටයුතු කළ යුතුය. ගිවිසුම්ගත ඉල්ලුම (Contract demand) සඳහා වන ගාස්තු, මනින ලද උපරිම ඉල්ලුම (measured maximum demand) මත ගාස්තු, බලශක්තිය සඳහා භාවිත කාලය පාදක මිලකරණය (TOU pricing), ප්‍රතික්‍රියාශීලී බලශක්තිය (Reactive power) හෝ ගබඩා කිරීම ඇතුළු සහායක සේවා සැපයීමේ ගාස්තු සහ සිල්ලර සේවා ගාස්තු ඇතුළත් පිරිවැය පරාවර්තක අයක්‍රමයක් නියාමක විසින් නිර්ණය කළ යුතුය. දැනට සිටින සම්ප්‍රේෂණ පාරිභෝගිකයින් සම්බන්ධයෙන් නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සිදු කරනු ලබන විදුලි ඉල්ලුම් ‘‘භාර පර්යේෂණ අධ්‍යයනයක්’’ මෙම අයක්‍රමයේ පදනම විය යුතුය.

2.3. සම්ප්‍රේෂණ කාර්යසාධනය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගකීම දැරිය යුතුය.

අ) ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ විධිවිධාන පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංශෝධිත කාලරාමුවක් සහිතව, නියාමක විසින් 2025 අංක 14 දරන පනතින් සංශෝධිත 2024 අංක 36 දරන විදුලිබල පනත යටතේ, 2016 විදුලිබල (සම්ප්‍රේෂණ) කාර්යසාධන ප්‍රමිති පිළිබඳ රෙගුලාසි නැවත නිකුත් කළ යුතුය.

ආ) රෙගුලාසිවල ඇති විධිවිධාන භාවිත කරමින් සකස්කරන ලද මිනුම් සලකුණුවලට වඩා විදුලියේ ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්මේ කාර්යසාධනය පහළ මට්ටමක පවතී නම්, බලපත්‍රලාභීන්ට කාර්යසාධනය ඉහළ නංවාගැනීම සඳහා දිරිගැන්වීමක් ලබා දෙන ආකාරයට සම්ප්‍රේෂණ අනුමත ආදායම සංශෝධනය කළ යුතුය.

ඇ) අතුරු පියවරක් ලෙස සම්ප්‍රේෂණ හානි ඉලක්කය බලශක්තියෙන් 3.5% කට සීමා කළ යුතුය .නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් විසින් නියාමක වෙත ලබා දෙනු ලබන දත්ත මත පදනම්ව, 2027 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත හානි ප්‍රමාණයන් නියාමක විසින් අධ්‍යයනය කර තීරණය කළ යුතුය.

ඇ) නියාමක විසින් , සෑම වර්ෂයක් සඳහාම, සම්ප්‍රේෂණ හානි ඉලක්කය සහ සත්‍ය සම්ප්‍රේෂණ හානි අතර සංසන්දනයක් ප්‍රකාශයට පත් කළ යුතුය.

ඉ) ප්‍රතිව්‍යුහගත කරන ලද විදුලිබල පද්ධතියේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම පිණිස ජනන/සම්ප්‍රේෂණ සීමාවන් හරහා සිදුවන විදුලි ගලායාම තක්සේරු කිරීමට හෝ මැනීමට යොදාගන්නා මනුකරණ යටිතල පහසුකම් හෝ වෙනත් මෙවලම් යාවත්කාලීන කිරීම සහතික කිරීම සඳහා විදුලිබල උත්පාදන බලපත්‍රලාභීන්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සහ නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ්ගේ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

2.4. බෙදාහැරීමේ සහ සිල්ලර සේවා අයක්‍රම පිරිවැය පරාවර්තක ආකාරයෙන් ද එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ ජාලය සඳහා වෙන වෙනම ද නිර්ණය කළ යුතුය.

අ) නිශ්චිත වත්කම්වලට හෝ ගනුදෙනුකරුවන්ට (සහාධිපත්‍යයක් වැනි) සීමා වූ සිය ව්‍යාපාරයේ විශේෂ ස්වභාවය හේතුවෙන් බෙදාහැරීමේ බලපත්‍රයක් තබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති සේවා සැපයුම්කරුවන් සඳහා, නියාමක විසින් එම සේවා සැපයුම්කරුවන් විසින් සපයා ඇති විශේෂිත ස්ථානීය තොරතුරු භාවිත කරමින් අයක්‍රම තීරණය කළ යුතුය.

ආ) බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් වාහන ආරෝපණය කිරීම හෝ ඒ හා සමාන සේවාවන් සඳහා විදුලිය නැවත විකුණන්නන් වෙත විකිණීම සඳහා ලබා දෙන අයක්‍රම සියළුම බෙදාහැරීම් බලපත්‍රලාභීන් අතර පොදුවේ ඒකීයව ක්‍රියාත්මක විය යුතු අතර පිරිවැය පරාවර්තක ඒවා විය යුතුය. පාරිභෝගිකයන් හා ආයෝජකයන් වෙත සාධාරණත්වය සහතික කිරීම සඳහා එවැනි සේවා සපයන්නන් විසින් සපයනු ලබන තොරතුරු භාවිත කර තීරණය කරනු ලබන එම සේවා සපයන්නන් විසින් සිය ගණුදෙනුකරුවන් වෙත ලබා දෙන නැවත විකිණීමේ අයක්‍රම නියාමක විසින් අධ්‍යනය කර ප්‍රකාශයට පත් කළ යුතුය.

2.5. බෙදාහැරීමේ කාර්ය සාධනය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගවිය යුතුය.

අ) ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංශෝධිත කාලරාමුවක් සහිතව නියාමක විසින් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත (2025 අංක 14 දරන පනතින් සංශෝධිත) යටතේ 2016 විදුලිබල (බෙදාහැරීම) පිළිබඳ කාර්යසාධන නියෝග නැවත නිකුත් කරනු ලැබිය යුතුය.

ආ) රෙගුලාසිවල ඇති විධිවිධාන භාවිත කරමින් සකස්කරන ලද පිල් සලකුණුවලට වඩා විදුලියේ ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්මේ කාර්යසාධනය පහළ මට්ටමක පවතී නම්, බලපත්‍රලාභීන්ට කාර්යසාධනය ඉහළ නංවාගැනීම සඳහා දිරිගැන්වීමක් ලබා දෙන ආකාරයට බෙදාහැරීම් අනුමත ආදායම සංශෝධනය කළ යුතුය.

ඇ) ජාලයේ පරාසය, පාරිභෝගික ඝනත්වය සහ බෙදා හරින ලද උත්පාදනයේ වර්ධනය වන දායකත්වය පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින්, එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අවම වශයෙන් ඉදිරි වසර පහක කාල සීමාවක් සඳහා පවත්වන ලද අධ්‍යයනයක් මත පදනම්ව, නියාමක විසින් අනුමත බෙදාහැරීමේ හානිය තීරණය කළ යුතුය.

ඈ) බලශක්ති හානි වටිනාකම, අලාභ ඉලක්කය අභිබවා ගියවිට බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් එය දැරිය යුතුය. ඒ හා සමානව, සැබෑ අලාභ හානි අගය ඉලක්කගත අගයට වඩා අඩු වූ විට සපයාගත් බලශක්තියේ වටිනාකම නැවත අය කර නොගත යුතුය. නියාමක විසින් සෑම බලපත්‍රලාභියෙකු සඳහාම, සෑම වසරකම බෙදා හැරීමේ ඉලක්කගත හානිය සහ සත්‍ය බෙදාහැරීමේ හානි අතර සංසන්දනයක් ප්‍රකාශයට පත් කළ යුතුය.

2.6. සිල්ලර සේවා සැපයීමේ දී වාණිජමය ගුණාත්මකභාවය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගවිය යුතුය.

අ) නව සේවා සම්බන්ධතා සඳහා ගත වන කාලසීමාව, අතිරේක සේවා, සිල්ලර සේවා සැපයුම් පිළිබඳ පාරිභෝගික පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම යනාදියට එහෙත් ඒවාට පමණක් සීමා නොවන සිල්ලර සේවා සහ වාණිජ තත්ත්ව දර්ශක, නියාමක විසින් නිර්වචනය කර එක් එක් බලපත්‍රලාභියා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

ආ) නියාමක විසින් එක් එක් බලපත්‍රලාභියාගේ ජාලයේ පරාසය, භූමි ආවරණය සහ අනෙකුත් විශේෂාංග අනුව සංසන්දනය කරමින් සහ කලාපයේ ඇති ඒ හා සමාන උපයෝගිතා ආයතන සමඟ පිල් ලකුණු කරමින් වාණිජමය සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳ දර්ශක ප්‍රකාශයට පත් කළ යුතුය.

2.7. නියාමක විසින් සිදු කරනු ලබන සියලුම ඇගයීම් නීත්‍යානුකූලව සකස් කරනු ලැබූ විගණනය කරන ලද නියාමන ගිණුම් මත පදනම් විය යුතුය.

අ) අයක්‍රම ගොනු කිරීමකින් අනතුරුව වන ඕනෑම අවස්ථාවක, බලශක්ති අමාත්‍යවරයා විසින් විගණකාධිපතිවරයාට (හෝ, මෙය ප්‍රායෝගික නොවේ නම්, විගණකාධිපතිවරයාගේ මඟ පෙන්වීම යටතේ පිළිගත් පෞද්ගලික විගණන සමාගමකට) ගාස්තු ගොනු කිරීම තුළ අන්තර්ගත සංඛ්‍යා දත්ත සත්‍යාපනය කිරීම සඳහා විශේෂ විගණනයක් පවත්වන ලෙස ඉල්ලා සිටිමින් බලය පැවරිය හැකිය. එසේ අයක්‍රම ගොනු කිරීම සිදු කරනු ලබන සියලුම බලපත්‍රලාභීන් අයක්‍රම නිර්ණය කිරීමේ කාර්යය උදෙසා විශේෂ විගණනයේ ප්‍රතිඵල යොදා ගැනීමට හැකි වන පරිදි කඩිනමින් නියාමක වෙත අවශ්‍ය සියලු තොරතුරු ලබා දීමට බැඳී සිටී.

3. ‘ජාතික විදුලිබල වෙළඳපොළ’ ආරම්භ කෙරෙන තුරු, අවසන් පරිභෝජක පාරිභෝගික වර්ගීකරණය, අයක්‍රම සහ අයක්‍රම විකල්ප ඇත්නම් සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා එකම ආකාරයකින් ක්‍රියාත්මක විය යුතුය.

3.1. ‘ජාතික විදුලිබල වෙළඳපොළ’ ආරම්භ කරන තෙක්, දිවයිනේ ඕනෑම ස්ථානයකින් බලපත්‍රලාභියෙකුගේ ජාලයකට සම්බන්ධ වී සිටින අවසන් පරිභෝජක පාරිභෝගිකයින් සඳහා පොදු ඒකීය ජාතික අයක්‍රමයක් ක්‍රියාත්මක විය යුතුය.

අ) විවෘත ප්‍රවේශය හරහා ජාලය පුරා චක්‍රීය බලශක්ති පහසුකම (wheeling of power) ස්ථාපිත වන තුරු, කුමන බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් සේවය ලබා ගන්නේ ද යන්න නොතකා, සියලුම ගනුදෙනුකරුවන්ට එකම අයක්‍රම බිල්පත් නිකුත් කරනු ලැබිය යුතුය.

ආ) එවැනි රෙගුලාසි නිකුත් කිරීමෙන් පසු විවෘත ප්‍රවේශය ලබන පාරිභෝගිකයින් හැරුණු කොට, අනෙක් සියලුම දෙනා, සිය බලපත්‍රලාභී සේවා සැපයුම්කරු කවුරුන් ද යන්න නොතකමින්, මෙම පොදු ජාතික අයක්‍රම අඛණ්ඩව ගෙවීමට කටයුතු කළ යුතුය.

ඇ) විවෘත ප්‍රවේශය සම්බන්ධයෙන් රෙගුලාසි හඳුන්වාදීම සඳහා කටයුතු කිරීමේ දී, නියාමක විසින් සෑම පාරිභෝගිකයෙකුම සඳහා වන (ජීව සහනදායි ගාස්තු ලබන පාරිභෝගිකයින් හැර) විදුලි මිල එම පාරිභෝගික කාණ්ඩය සහ උප කාණ්ඩය[7] සඳහා ගණනය කරන ලද සැපයුම් පිරිවැයෙන් +/- 15% ක් දක්වා ක්‍රම ක්‍රමයෙන් ගෙන ආ යුතු බව සහතික කළ යුතුය.

3.2. අනාගතයේදී විවෘත ප්‍රවේශයට ඉඩ ලබා දීම සඳහා කටයුතු සකස් කිරීමේ දී, මධ්‍යම හා විශාල පාරිභෝගිකයින්ට සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල වෙත විවෘත ප්‍රවේශය සිතියම් ගත කළ යුතුය.

අ) විවෘත ප්‍රවේශ ගාස්තු ගණනය කිරීම සහ විවෘත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමේ දිනය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට පහසුකම් සැලසීම සඳහා, විවෘත ප්‍රවේශ ගාස්තු ගණනය කිරීම සහ විවෘත ප්‍රවේශ විභවය සහිත සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන් පිළිබඳ සමීක්ෂණයක් පිළිබඳ වාර්තාවක් නියාමක විසින් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ නියම කර දක්වන නියමිත දිනයේ සිට එක් වසරක් ඇතුළත දී බලශක්ති අමාත්‍යවරයා වෙත ලබා දිය යුතුය. එම වාර්තාව තුළ, විවෘත ප්‍රවේශ ගාස්තු ඇතුළත් විය යුතු අතර ඊට සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ගාස්තු, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අලාභ හානි, බැංකු හෝ ගබඩා ගාස්තු, ස්වාධීන ධාරිතා ගාස්තු, අන්‍යෝන්‍ය සහනාධාර අධිභාර, දැනට ක්‍රියාත්මක විදුලිය මිලදී ගැනීමේ (සම්මත) විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වල කාල සීමාව අවසානයේ විවෘත ප්‍රවේශයට යාමට තෝරාගැනීමට ඉඩ ඇති සංවර්ධිත පුනර්ජනනීය බලශක්ති පාදක බලාගාර සඳහා වන ගාස්තු ආදිය ද ඇතුළත් වේ.

ආ) විවෘත ප්‍රවේශය මගින් බලපත්‍රලාභී උත්පාදන, සම්ප්‍රේෂණය හා බෙදාහැරීමේ ආයතන, නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් හෝ අවසාන් පරිභෝජක පාරිභෝගිකයින් කිසිවෙකුටත් අවාසිදායක තත්වයක් ඇති නොවිය යුතුය. විවෘත ප්‍රවේශය සඳහා ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට ප්‍රවිෂ්ට වීමට සාධාරණ තරඟකාරිත්වයක් ඇති කරවීමට කටයුතු කළ යුතු අතර, විවෘත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම අවසාන් පරිභෝජක පාරිභෝගිකයින්හට අහිතකර බලපෑමක් ඇති නොකළ යුතුය.

4. කුටුම්භ සඳහා වන ජීව සහනදායි අයක්‍රම සහ අනෙකුත් සහන අයක්‍රම සුදුසුකම් ලත් පාරිභෝගිකයින් ඉලක්ක කරමින් ලබා දිය යුතුය. සහනාධාර සඳහා මුදල් යෙදවීම අන්‍යෝන්‍ය සහනාධාරවලින් බැහැරව රජයේ අයවැයෙන් සෘජුව ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම දක්වා ක්‍රමයෙන් වෙනස් කළ යුතුය.

4.1. ජීව සහනදායි අයක්‍රම, ක්‍රමයෙන් සුදුසු ගනුදෙනුකරුවන් ඉලක්ක කරමින් ලබා දිය යුතුය.

අ) 2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුකූලව ගෘහස්ථ සහ ආගමික කාණ්ඩය සඳහා වන මූලික ජීව සහනදායි අයක්‍රම කාණ්ඩය මෙම ප්‍රතිපත්ති බලාත්මක වන අවස්ථාවේ සිට මසකට කි.වො.පැ. 1 සිට 30 දක්වා විය යුතුය.

ආ) මින් පෙර මූලික අවශ්‍යතාව ලෙස මසකට කි.වො.පැ.30ක් ආලෝකකරණය සඳහා පමණක් යොදාගැනීම සිදුවිය. නවීන, වඩාත් කාර්යක්ෂම ආලෝකකරණ උපාංග මගින් ආලෝකකරණයේ අවශ්‍යතාවය මසකට කි.වෝ. 30 ට

7 පාරිභෝගික කාණ්ඩය යනු භාවිතයේ අරමුණ (ගෘහස්ථ, පොදු අරමුණු, කර්මාන්තය වැනි) වන අතර, උප කාණ්ඩය යනු කාණ්ඩයක කාණ්ඩගත අයක්‍රම, සැපයුම් වෝල්ටීයතාවය සහ ඒ හා සමාන උප අංශවල පාරිභෝගිකයා අයත් ස්ථානයයි.

වඩා අඩු කර ගත හැකි අතර, වර්තමානයේ මූලික විදුලි අවශ්‍යතා අතරට අධ්‍යාපනික උපාංග සහ ප්‍රමාණවත් වාතාශ්‍ර පහසුකම් සහ ශීතකරණය වැනි එදිනෙදා ජීවිතයේ සුවපහසුව සඳහා යොදාගැනෙන වෙනත් උපකරණ සීමිත ප්‍රමාණයක් ද ඇතුළත් වේ. මසකට කි.වො.පැ.30ක ජීව සහනදායි අවශ්‍යතාව සම්බන්ධයෙන් සංශෝධන නිර්දේශ කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් මෙම ප්‍රතිපත්තිය බලාත්මක වන දිනයේ සිට එක් වසරක් තුළ අවශ්‍යතා තක්සේරුවක් සකස් කර බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

ඇ) අඩු ආදායම්ලාභී ගෘහස්ථ පාරිභෝගිකයින් අතර විදුලිය දැරිය හැකි මිලකට ලබා දීම සහ සුදුසු ගෘහස්ථ පාරිභෝගිකයින් වෙත සහනාධාර ලබා දීම සම්බන්ධයෙන් ඉලක්ක කිරීම ඉහළ නැංවීම පිළිබඳව නියාමක විසින් අධ්‍යයනයක් සිදු කරනු ලැබිය යුතු අතර, අයක්‍රම ප්‍රතිපත්තිය තුළ මෙම ක්‍රියාමාර්ගය සංශෝධනය කිරීම සඳහා මෙම පනත බලාත්මකවූ දිනයේ සිට සෑම වසර තුනකටම වරක් බලශක්ති අමාත්‍යාංශය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

ඇ) කුටුම්භ, ආගමික පරිශ්‍ර සහ කර්මාන්ත සඳහා වන සහනාධාර වෙනුවෙන් දැනට මුදල් සැපයීම සිදු කරනු ලබන්නේ අනෙකුත් කුටුම්භ සහ ව්‍යාපාරවලින් උපයා ගන්නා අන්‍යෝන්‍ය සහනාධාර මගිනි. අන්‍යෝන්‍ය සහනාධාරවලින් බැහැරව රජයේ අයවැයෙන් සෘජුව ප්‍රතිපාදන වෙන් කරගැනීම දක්වා ක්‍රම ක්‍රමයෙන් යොමුවීම, මෙය බලාත්මක වීමෙන් වසර තුනක් තුළ ඉලක්කගත කාණ්ඩය මත පදනම්ව ක්‍රියාත්මක කළ යුතුය. ජීව සහනදායි නොවන පාරිභෝගිකයින් වෙත පිරිවැය පරාවර්තක අයක්‍රමවලින් ඇති වන බලපෑම් අවම කිරීම සඳහා සංක්‍රාන්ති කාල සීමාවේදී සීමිත කාලයක් ඇතුළත අවශ්‍ය සුරක්ෂිත පියවර ක්‍රියාත්මක කළ යුතුය.

4.2 වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීමේ පිරිවැය, අයක්‍රම හරහා සමාජීයකරණය කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතුය.

අ) නියාමක විසින් ප්‍රකාශයට පත් කරන වීදි ආලෝකකරණය සඳහා භාවිත වන බලශක්තිය සඳහා වන අයක්‍රම, සපයනු ලබන ධාරිතාව සහ බලශක්තිය භාවිත කරන වේලාවන් ද සලකා බලමින්, පිරිවැය පරාවර්තක විය යුතුය.

ආ) ඕනෑම අවසන් පරිභෝජක පාරිභෝගිකයෙකුට එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියා සහ නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නිකුත් කරන ලද ඉන්වොයිසියක බලශක්ති සංරචකයෙන් උපරිම 2.2% කට යටත්ව, වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීම සඳහා අය විය යුතු බලශක්ති අයක්‍රම වලින් පැන නගින පිරිවැය, සියලුම පාරිභෝගික කාණ්ඩ ඔස්සේ ඔවුන් අතර බෙදී යන ලෙස සමාජගත කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතුය.

ඇ) සෑම බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුම බලපත්‍රලාභියාගේ සේවා ප්‍රදේශයේ ඇති වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීමේ කාර්යය සඳහා ඒවායේ වර්ගය, ධාරිතාව සහ ඇස්තමේන්තුගත මාසික බලශක්තිය පිළිබඳව සමීක්ෂණයක් මෙම ප්‍රතිපත්තිය බලාත්මක වූ දිනයේ සිට එක් වසරක් තුළ ඉදිරිපත් කළ යුතුය.

ඇ) වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීම සඳහා සමාජීයකරණය කරන ලද බලශක්ති අයක්‍රම නියාමක විසින් විනිවිදභාවයෙන් යුතුව ප්‍රකාශයට පත් කළ යුතු අතර බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් පාරිභෝගිකයින් වෙත නිකුත් කරන සහ ඇතැම් අවස්ථාවකදී නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් සම්ප්‍රේෂණ ජාලය හරහා සේවය ලබා ගන්නා පාරිභෝගිකයින් වෙත නිකුත් කරන ඉන්වොයිසිවල එය සඳහන් කිරීම මෙම ප්‍රතිපත්තිය බලාත්මක වූ දිනයේ සිට එක් වසරක් ඇතුළත සිදු කරනු ලැබිය යුතුය.

ඉ) මෙම ප්‍රතිපත්තිය බලාත්මක වූ දිනයේ සිට එක් වසරක් ඇතුළත, මෙරට වීදි සහ පොදු ස්ථාන ආලෝකකරණය සම්බන්ධයෙන් එම කාර්යය පැවරීමට, පුනරුත්ථාපනය කිරීමට, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කර පවත්වාගෙන යාමට ජාත්‍යන්තර යහපුරුදු අනුගමනය කරමින් නව ආයතනයක් පිහිටුවීමට බලශක්ති අමාත්‍යාංශය කටයුතු කළ යුතුය. නව ආයතනය විසින් එවැනි වීදි ආලෝක සඳහා ඒවායේ සමාජගත පිරිවැය නිවැරදිව ගණනය කිරීමට හැකි වන පරිදි නිවැරදි බලශක්ති මිනුම් ඇති කිරීම හෝ ඒවා ක්‍රියාකාරී වන වේලාවන් නිරීක්ෂණය කිරීම කළ යුතුය.

ඊ) භාවිතා කළ බලශක්තියට අමතරව, වීදි සහ පොදු ස්ථාන ආලෝකකරණය සඳහා වන ආයෝජන සහ නඩත්තු වියදම්, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සහ නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් අය කරනු ලබන සහ ඉහත විස්තර කර ඇති ආයතනය වෙත ප්‍රේෂණය කෙරෙනු ඇති පරිදි පාරිභෝගික අයක්‍රම මත බද්දක් ලෙස ඇතුළත් කළ යුතුය. මෙම බදු මුදලේ ප්‍රමාණය පිළිබඳව අමාත්‍යවරයා විසින් ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් නිකුත් කළ යුතුය.

උ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින්, මෙම ප්‍රතිපත්තිය බලාත්මක වූ දිනයේ සිට එක් වසරක් ඇතුළත ආලෝකකරණයට සුදුසු වීදි සහ පොදු ස්ථාන තීරණය කිරීම සඳහා තාක්ෂණික සැලසුම් ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කළ යුතු අතර ඒවායේ පිරිවැය සමාජීයකරණය කෙරෙනු ඇත.

ඌ) භාවිතකරන්නන් විසින් සෘජුව හෝ වක්‍රව සේවාවන් සඳහා ගෙවීම් සිදු කරන සහ ප්‍රවේශය පාලනය කර ඇති (අධිවේගී මාර්ග සහ කාර්මික කලාප වැනි) වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීම සඳහා වන බලශක්තිය, ආයෝජන හා නඩත්තු පිරිවැය, අයක්‍රම හරහා සමාජීයකරණය නොකළ යුතුය.

5. සෑම පාරිභෝගික කාණ්ඩයකටම (ප්‍රතිපත්ති ප්‍රකාශන 3 සහ 4 හි සීමාවන්ට යටත්ව) පිරිවැය පරාවර්තක අයක්‍රම අදාළ විය යුතුය. අහිතකර ලෙස බලපෑමට ලක්වන, සුදුසු පාරිභෝගිකයින් සඳහා අතුරු සහන ලබා දිය යුතුය.

5.1. සේවා පිරිවැයෙහි විනිවිදභාවය ඉහළ නැංවිය යුතුය.

අ) මෙම ප්‍රතිපත්තිය බලාත්මක වීමෙන් වසරක් ඇතුළත, නියාමක විසින්, මහජන අදහස් ලබා ගැනීම පිණිස සැපයුම් පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදය අර්ධවාර්ෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

ආ) නියාමක විසින්, පාරිභෝගික අයක්‍රම වල එක් එක් වෙනස්වීම් සමඟ, ස්ථාවර පිරිවැය (සිල්ලර ගනුදෙනුකරුවන් සඳහා), බලශක්ති පිරිවැය (කාල පරතරයන් තුනකින් බෙදා ඇත), ඉල්ලුම් පිරිවැය (තොග පාරිභෝගිකයින් සඳහා) සහ සිල්ලර සේවා පිරිවැය ලෙස වෙන් කර, එක් එක් පාරිභෝගික කාණ්ඩයට සහ උප කාණ්ඩයට (සහ සිල්ලර ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් එක් එක් කාණ්ඩගත කොටසට) බෙදාහැරීමේ වෝල්ටීයතාවයන් සහ සම්ප්‍රේෂණ වෝල්ටීයතාවයන් මට්ටමේ පාරිභෝගිකයින් දක්වාම සේවා පිරිවැය ගණනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලැබිය යුතුය. ජාලක ධාරිතාව උපරිම ලෙස භාවිතයට ගනු ලබන කාලයට සමගාමීව, එම පාරිභෝගික කාණ්ඩයෙන් ජාලයට ඇති බලපෑම සිල්ලර ගනුදෙනුකරුවන්ට අදාළ එක් එක් කාණ්ඩය සඳහා වන ස්ථාවර පිරිවැය මගින් පිළිබිඹු කෙරෙනු ඇත.

ඇ) බෙදාහැරීමේ සහ සැපයුම් බලපත්‍රලාභීන් විසින්, සහ සම්ප්‍රේෂණ වෝල්ටීයතාවයන්ගෙන් විදුලි සැපයුම ලබා ගන්නා පාරිභෝගිකයින් සම්බන්ධ අවස්ථාවලදී නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පාරිභෝගිකයින්ට නිකුත් කරන ඉන්වොයිසිවල අවම වශයෙන් පහත සඳහන් පිරිවැය සඳහන් කළ යුතුය: උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, සිල්ලර සේවා, මුළු පිරිවැය, සහනාධාරය හෝ අධිභාරය, ඉන්වොයිසි මුදල් අගය. තොග පාරිභෝගිකයින් සඳහා ඉහත පිරිවැය, ධාරිතාව සහ බලශක්ති පිරිවැය ලෙස බෙදා ඉදිරිපත් කළ යුතුය. අයබදු සහ තීරුබදු වෙන වෙනම දක්වනු ලැබිය යුතුය. සම්බන්ධතා ගිවිසුම්වල දක්වා ඇති පරිදි, විදුලි ජාලය වෙත එක් කරන ලද බලශක්තිය සහ ආනයනයන් මත සසඳන ලද ප්‍රමාණයන් පිළිබඳ නිසි තොරතුරු, සියලුම පාරිභෝගික ඉන්වොයිසිවල දැක්විය යුතුය.

5.2. අවසන් පරිභෝජක පාරිභෝගික මිල ව්‍යුහය සරල කළ යුතුය, ක්‍රමානුකූලව පිරිවැය පරාවර්තක කළ යුතුය, සමානාත්මතාවය පිළිබිඹු කළ යුතුය, එමෙන්ම ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූල වන පරිදි ජාත්‍යන්තර යහ පුරුදු කරා යොමු විය යුතුය.

අ) ශුද්ධ මනුකරණ සහ ශුද්ධ ගිණුම්කරණ ගිවිසුම් යටතේ සිටින නිෂ්පාදක පාරිභෝගිකයින් ඇතුළුව සියලුම පාරිභෝගිකයින් සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් බිල්පත්වල නිකුත් කරනු ලබන මාසික ස්ථාවර ගාස්තුව, විදුලි ජාලයෙන් ආනයනය කරන ලද දළ බලශක්තිය මත පදනම්ව විය යුතුය. ඒ අනුව ස්ථාවර ගාස්තු බිල්පත් කිරීමේදී ජීව සහනදායි ගාස්තු ගෙවන පාරිභෝගිකයින් නිෂ්පාදක පාරිභෝගිකයින් ලෙස වැරදි ආකාරයෙන් අර්ථකථනය කිරීම මෙම ප්‍රතිපත්තිය අනුමත කළ දින සිට අවසන් විය යුතුය.

ආ) ඉහත කරුණ සැලකිල්ලට ගනිමින්, සිල්ලර ගනුදෙනුකරුවන්ගෙන් සැලකිය යුතු කොටසකගේ බලශක්ති පරිභෝජකය ශුන්‍ය අගයක් ගැනීම නිසා අක්‍රිය පාරිභෝගිකයින් ද ජීව සහනදායි ගාස්තු ගෙවන පාරිභෝගිකයින් හෙවත් අඩු පරිභෝජකයක් සහිත පාරිභෝගිකයින් ලෙස වැරදි අර්ථකථනයකට හේතු වී තිබීම සම්බන්ධව සලකා බලමින්, එවැනි ගනුදෙනුකරුවන්ගෙන් සම්පූර්ණ ස්ථාවර පිරිවැය අය කරගැනීම සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් කටයුතු කළ යුතුය. පාරිභෝගික කාණ්ඩයේ ගණනය කළ ස්ථාවර පිරිවැය (උදා: සියලුම කුටුම්භ) සහ සිල්ලර සේවා පිරිවැය, ස්ථාවර පිරිවැයට ඇතුළත් විය යුතුය. මීට අමතරව, මීළඟ අයක්‍රම නිර්ණයට පෙර, නියාමක විසින් එවැනි ගනුදෙනුකරුවන් පිළිබඳව එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් නියැදි සමීක්ෂණයක් සිදු කර පරිභෝජකය ශුන්‍ය අගයක් ගැනීමට හේතුව හඳුනා ගත යුතුය. පරිභෝජකය ශුන්‍ය බවට වාර්තා වන එවැනි පාරිභෝගිකයන්ගෙන් අය කළ යුතු ස්ථාවර ගාස්තු සෑම බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින්ම නිර්දේශ කළ යුතුය.

ඇ) 2030 වසර වන විට සරල කරන ලද සහ වැඩිදියුණු කරන ලද පාරිභෝගික අයක්‍රම ව්‍යුහයක් ඇති කිරීමේ අවසාන ඉලක්කය සමඟින් පාරිභෝගික කාණ්ඩ සහ අයක්‍රම ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කාලානුරූපී මාර්ග සිතියමක් සකස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම නියාමක විසින් සිදු කළ යුතු අතර, එමඟින් සේවා සඳහා අය කිරීම, විදුලිබල පද්ධතිය භාවිත කිරීම සහ බලශක්ති මිලදී ගැනීම් සඳහා පහසුකම් සැලසෙනු ඇත. ක්‍රියාත්මක කළ යුතු සරල කිරීම් නම් (i) සංරක්ෂණය දිරිමත් කිරීම සඳහා මිල සංඥා පවත්වා ගනිමින් ගෘහස්ථ සහ ආගමික පාරිභෝගික කාණ්ඩවල කාණ්ඩගත කොටස් ගණන අඩු කිරීම, (ii) සියලුම පරිමාවේ වෙනස්කම් ඉවත් කිරීම, (iii) ප්‍රතික්‍රියාශීලී බලශක්ති ගාස්තු (reactive energy charges) හෝ ජව සාධක දඩ ගාස්තු (power factor penalties) ප්‍රගතිශීලීව ක්‍රියාත්මක කිරීම ය.

ඇ) සෑම පාරිභෝගික කාණ්ඩයක්, උප කාණ්ඩයක් සහ කාණ්ඩගත කොටසක් සඳහා වන සැපයුම් පිරිවැය සියලුම ස්ථාවර ගාස්තු (හෝ මනින ලද ඉල්ලුම මත පදනම් වූ ගාස්තු), බලශක්ති ගාස්තු (භාවිත කරන වේලාව අනුව බෙදා ඇති), සිල්ලර සේවා, ජව සාධකය මත පදනම් වූ දඩ ගාස්තු හෝ ඒ හා සමාන ගාස්තු තුළ පූර්ණ ලෙස පිළිබිඹු විය යුතුය. වසර පහක කාලසීමාවක් තුළ, සෑම පාරිභෝගික කාණ්ඩයකටම සහ කාණ්ඩගත කොටසකටම 5% ට නොවැඩි

අපගමනයක් සහිතව ස්ථාවර ගාස්තු ස්ථාවර පිරිවැයට ගැළපීම සහ බලශක්ති ගාස්තු බලශක්ති පිරිවැයට ගැළපීම සිදු කළ යුතුය.

ඉ) දවසේ විවිධ කාලයන්, සතියේ දින සහ ඍතුමය විචලනයන් මුළුල්ලෙහි උත්පාදන පිරිවැය ඇතුළත් විශ්ලේෂණයක් හරහා සහ උත්පාදන මිශ්‍රණයේ නැගී එන ප්‍රවණතා සලකා බලමින් නියාමක විසින් නිර්ණය කරන ලදුව අවසන් පරිභෝජක පාරිභෝගිකයින් සඳහා සහ සම්ප්‍රේෂණයේ සිට බෙදා හැරීම දක්වා හුවමාරු කිරීම් සඳහා පදනම් රහිත ලෙස නියම කර ඇති දැනට පවතින භාවිත කරන වේලාව පාදක බලශක්ති අයක්‍රම, පිරිවැය පරාවර්තක විය යුතුය.

ඊ) සියලුම අඩු වෝල්ටීයතා පාරිභෝගිකයින් සඳහා භාවිත කරන වේලාව පාදක අයක්‍රම ක්‍රමයෙන් හඳුන්වා දිය යුතු අතර, එම එක් එක් අයක්‍රම සංරචකය තුළ පිරිවැය ද, බලශක්ති සංරචකය තුළ විවිධ භාවිත කාලවලදී සැපයුම් පිරිවැය ද පිළිබිඹු විය යුතුය. තෙකළා පාරිභෝගිකයින් ලෙස මාරුවීම සඳහා බලපත්‍රලාභීන් සමඟ සාකච්ඡා කර 2026 වන විට නිම කෙරෙන පරිදි පුළුල් හා කාලානුරූපී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට සහ ඉලක්කගත වසර වන විට සියලුම පාරිභෝගිකයින් ආවරණය වන පරිදි ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට නියාමක විසින් කටයුතු කළ යුතුය. මෙම මුලපිරීම යටතේ ස්ථාපනය කෙරෙන සියලුම පාරිභෝගික මණ්ඩකරණ කටයුතු දුරස්ථව සිට ප්‍රවේශ වී සිදුකල හැකි සහ ඉල්ලුම ප්‍රතිචාර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හැකි වන පරිදි විය යුතුය.

උ) භාවිත කාලය පාදක අයක්‍රමවල දී දැනට උපයෝගී වන කාල පරතරයන්හි වෙනස්කම් නිර්ණය කිරීමට, බෙදා හරින ලද උත්පාදනයේ නැගී එන ප්‍රවණතා සපුරාලීමට සහ ඉල්ලුම කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ අරමුණු සපුරාලීමට මෙන්ම එහි ප්‍රතිඵල ක්‍රියාත්මක කිරීමට නියාමක විසින් අධ්‍යයනයක් සිදු කරනු ලැබිය යුතුය.

6. ආර්ථික කටයුතු, පිරිවැය සහ තාක්ෂණික වශයෙන් කාර්යක්ෂම භාවිතය, ඉල්ලුම් කළමනාකරණය සහ සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය වන පරිදි අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම සැකසිය යුතුය.

6.1. ඉල්ලුම් කළමනාකරණය සහ ඉල්ලුම් ප්‍රතිචාර උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

අ) බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අවම වශයෙන් අවුරුදු 5ක කාල පරතරයකින් යුතුව, එක් එක් කාණ්ඩය සහ උප කාණ්ඩය සහ කාණ්ඩගත පාරිභෝගික කොටස සඳහා වන පාරිභෝගික ඉල්ලුමේ ලක්ෂණ තක්සේරු කිරීම සඳහා විදුලි ඉල්ලුම පරීක්ෂා කිරීමේ විදුලි භාර පර්යේෂණ පැවැත්විය යුතුය. නියාමක විසින් පාරිභෝගිකයාගේ පෞද්ගලිකත්වය සුරක්ෂිත කරමින් සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රවේශය සහතික කරමින්, විද්‍යාත්මක නියැදීම, සමීක්ෂණ ක්‍රමවේදය සහ තොරතුරු වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම කළ යුතුය.

ආ) ඇණහිටීම් අයක්‍රම (interruptible tariffs) සහ උපායමාර්ගික ඉල්ලුම කළමනාකරණය, පාරිභෝගික උපාංග මට්ටම් වලදී මැදිහත්වීම් ඇතුළුව ඉල්ලුම කළමනාකරණ උපාය මාර්ග සහ තාක්ෂණයන් පිළිබඳව බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් අධ්‍යයනය කළ යුතුය. නියාමක විසින් මෙම අධ්‍යයනයන් සමාලෝචනය කළ යුතු අතර බලශක්ති අමාත්‍යාංශය වෙත ප්‍රතිපත්ති සංශෝධන යෝජනා කළ යුතුය.

ඇ) ඉල්ලුම් පැතිකඩ වැඩිදියුණු කිරීම සහ සුමට කිරීම සඳහා, 2027 වසර අවසන් වන විට එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින්, නියාමකගේ අනුමැතිය සහිතව, තෝරාගත් පාරිභෝගිකයින් සඳහා අවම වශයෙන් එක් ඉල්ලුම් ප්‍රතිචාර අයක්‍රමයක් ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් වන පාරිභෝගික ප්‍රතිචාරය තක්සේරු කිරීම සඳහා අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කරනු ලැබේ.

ඈ) විදුලි වාහන භාවිතය වැනි විදුලිය යොදාගනිමින් නම්‍යශීලීව භාරයන් ප්‍රයෝජනයට ගැනීම, විදුලි ඉල්ලුම විතැන් කිරීම හෙවත් විදුලිය භාවිත කරන කාලය වෙනස් කිරීම (demand shifting) වැනි නම්‍යශීලී සේවා නිපැයුම් හඳුන්වාදීමට නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය.

6.2. මිලකරණ ප්‍රතිපත්තිය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සහ විශ්ලේෂණය කිරීම විධිමත් කළ යුතුය.

අ) වත්මන් සහ ඉදිරි අනාගතයේදී ඇති විය හැකි මිලකරණ ප්‍රතිපත්ති ගැටළුවලට අදාළ පර්යේෂණ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ පාර්ශවකරුවන් සහ පර්යේෂණ සංවිධාන සමඟ අන්තර් ක්‍රියාකාරීත්වය පවත්වාගැනීමට හැකිවන අයුරින් බලශක්ති අමාත්‍යාංශය තුළ මිලකරණය පිළිබඳ පර්යේෂණ ඒකකයක් පිහිටුවිය යුතුය. රාජ්‍ය අංශයේ ආයතන අතරට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මුදල් අමාත්‍යාංශය (MOF) සහ ඉදිරියේදී හඳුනාගනු ලබන වෙනත් අදාළ ආයතන ඇතුළත් වනු ඇත. ඉහත සඳහන් කළ සමීක්ෂණවලින් රැස් කරනු ලැබූ දත්ත මෙම ආයතනය මගින් සැපයෙනු ඇත. ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහා වන පර්යේෂණ සඳහා එම දත්ත ලබා ගැනීමට හැකියාව සැලසෙනු ඇති අතර පාරිභෝගික රහස්‍යභාවය සුරක්ෂිත කිරීම පිණිස ඒ මත පනවන සීමාවන්ට යටත්ව එය සිදු කෙරෙනු ඇත.

7. අයක්‍රම නිර්නය කිරීමේ ක්‍රියාවලියේ සුවිශේෂී ලක්ෂණ සහ පුනර්ජනනීය බලශක්ති සම්පත්වල වාරයන්ට සීමා වීමේ ස්වභාවය සහ පොසිල ඉන්ධන මිල ගණන්වල විචලනයන් හේතුවෙන් වන අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රමවල උච්චාවචනයන් සුමට කළ යුතුය.

7.1. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ බලපත්‍රලාභීන් අතර ගනුදෙනු කළමනාකරණය කිරීමේ මාධ්‍යය තොග සැපයුම් ගනුදෙනු ගිණුම (BSTA) විය යුතු අතර, තොග සැපයුම් ගනුදෙනු (BST) කාල පරිච්ඡේද අතර ඇති ඕනෑම හිඟයක් නිවැරදි කිරීමට හෝ අතිරික්තයක් අවශෝෂණය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

අ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් "නියමිත දිනය" වන විට පවතින තොග සැපයුම් ගනුදෙනු ගිණුම ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ යුතුය.

ආ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සෑම සතියකම අවසානයේ දී තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ගනුදෙනු සහ අවසන් ශේෂය පිළිබඳව මුදල් අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය සහ නියාමක වෙත වාර්තා කළ යුතුය. නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සෑම මසකම අවසානයේ දී ආසන්නතම සතියට අදාළ අවසන් ශේෂය පොදු වේදිකාවක ප්‍රකාශයට පත් කළ යුතුය.

7.2. ගාස්තු වෙනස්කිරීම් පාරිභෝගිකයින් සඳහා අපීරුතා ඇති කරවන සහ රටේ ව්‍යාපාරික පරිසරය තුළ අවිනිශ්චිතතාවක් නිර්මාණය කරවන හෙයින් අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම නිරන්තරයෙන් වෙනස් කිරීමට සිදු නොවන ආකාරයෙන් තොග සැපයුම් ගනුදෙනු ගිණුම කළමනාකරණය කළ යුතුය.

අ) නියාමක විසින් සෑම වසරකම සුදුසු දිනයක් (වඩාත් යෝග්‍ය ලෙස ජල වර්ෂය ආරම්භ වන දිනය වන ඔක්තෝබර් 1 වන දින) අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම වෙනස් කිරීමේ දිනය ලෙස නම් කළ යුතුය. මෙම දිනයේදී, ඉදිරි වසරේ සැපයුම් සඳහා වන මුළු පුරෝකථන පිරිවැය නිර්ණය කරනු ලැබිය යුතු අතර, පුරෝකථනය කළ ආදායම පුරෝකථනය කළ සැපයුම් පිරිවැයට සමාන වන පරිදි මුළු වර්ෂය සඳහා ම අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම ගළපා සකස් කළ යුතුය.

ආ) 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 29 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, බලපත්‍රලාභීන් විසින් තොරතුරු ඉදිරිපත් කිරීම මත පදනම්ව තොග විකුණුම් අයක්‍රම, තොග මිලදී ගැනීමේ අයක්‍රම සහ සැපයුම් අයක්‍රම පිළිබඳ සෑම කාර්තුමය සමාලෝචනයකදී නියාමක විසින් යාවත්කාලීන කරන ලද ඉල්ලුම් පුරෝකථන, ජල හා සුළං සම්පත්, ඉන්ධන මිල සමාලෝචනය කළ යුතු අතර ඉතිරි අයක්‍රම කාල පරාසය සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ බලාපොරොත්තු වන විචලනයන් ප්‍රකාශයට පත් කළ යුතු ය. අවසන් පරිභෝජක පාරිභෝගික අයක්‍රම වෙනස් කළ යුතු දිනයේදී හැර, කාර්තුමය සමාලෝචනවලදී අයක්‍රම වෙනස් කිරීමක් සඳහා මුලපිරීම නියාමක විසින් නොකළ යුතුය. කෙසේවුවද, ඉදිරි අවසන් පරිභෝජක පාරිභෝගික ගාස්තු වෙනස් කිරීමේ දිනයේදී අයක්‍රම සම්බන්ධයෙන් ගැලපීම් සිදුවිය හැකි බව නියාමක විසින් හැඟවිය යුතුය.

ඇ) තොග සැපයුම් ගනුදෙනු ගිණුමෙ හි කිසියම් සෘණ ශේෂයක් ඇත්නම්, එය වසර 3 ක කාල සීමාවක් සඳහා නියාමක විසින් අනුමත කරන ලද පොලී (ප්‍රකාශිත දර්ශක මත පදනම් සූත්‍රයක්) සහිත ස්ථාවර ණය පහසුකම් හරහා මූල්‍යනය කරනු ලැබිය යුතුය. ඒ හා සමානව, තොග සැපයුම් ගනුදෙනු ගිණුමෙ හි ධන ශේෂයක් ඇත්නම්, ඒ සඳහා පොලිය (ප්‍රකාශිත දර්ශක මත පදනම් වූ සූත්‍රය අනුව) ලැබී තොග සැපයුම් ගනුදෙනු ගිණුමට බැර වනු ඇත.

ඈ) පාරිභෝගික අයක්‍රම වෙනස්කිරීමක් ඇති නොවන පරිදි සහ වාරයන්ට සීමාවීමේ ස්වභාවය සහ ඉන්ධන මිල උච්චාවචනයන් ආවරණය වන පරිදි, තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ශේෂයේ අගයට සාපේක්ෂව තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ශේෂය, මුළු වාර්ෂික විදුලි සැපයුම් පිරිවැයෙන් 10% කින් ඉහළ යාමට හෝ අඩු වීමට අවසර ලබා දිය යුතුය.

ඉ) තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ශේෂය අඛණ්ඩව සති දෙකක් තුළ 10% සීමාව කරා ළඟා වුවහොත්, නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නියාමක වෙත ඒ සම්බන්ධයෙන් දැනුම් දිය යුතු අතර, විශේෂ තත්වයක් කරා ළඟා වී ඇති බවට නියාමක විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත අනිවාර්යයෙන් දැනුම් දිය යුතු අතර, ඔවුන් විසින් පාරිභෝගික අයක්‍රම 10% කින් වැඩි කිරීමට (හෝ අවස්ථානුගතව අඩු කිරීමට) කටයුතු කළ යුතුය.

ඊ) තොග සැපයුම් ගනුදෙනු ගිණුම පහළ සීමාවට ළඟා වූ පසු 10% ක වැඩිවීමක් තාවකාලිකව අත්හිටුවීමට නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නියාමක හට නිර්දේශ කළ හැකි අතර මෙම තත්ත්වය තවත් සතියකට වඩා නොඉක්මවන කාලයක් පවතිනු ඇති බව නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ්ගේ මතය වේ නම්, එම මතය සමඟ දත්ත සහ විශ්ලේෂණයන් ඉදිරිපත් කළ යුතුය.

උ) තොග සැපයුම් ගනුදෙනු ගිණුම ඉහළ සීමාවට ළඟා වූ පසු 10% ක අඩු කිරීමක් තාවකාලිකව අත්හිටුවීමට සහ තොග සැපයුම් ගනුදෙනු ගිණුම සඳහා ආධාරක වශයෙන් ලබාගත් මූල්‍ය පහසුකම් සඳහා මුදල් පියවීමට හෝ තොග සැපයුම්

ගනුදෙනු ගිණුමට ආධාරක පිණිස සංචිතයක් ගොඩනඟා ගැනීම සඳහා එම අරමුදල් රඳවා තබාගැනීමට නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නියාමක හට නිර්දේශ කළ හැකිය. රඳවා ගන්නා එවැනි අරමුදල් නියාමක විසින් ලබා දෙන මාර්ගෝපදේශ යටතේ අයකුම ස්ථායීකරණ ගිණුම ලෙස නම් කරන වෙනම ගිණුමක තැන්පත් කළ යුතුය.

ඌ) ශ්‍රී ලංකා විදුලිබල පනතේ හෝ මෙම අයකුම ප්‍රතිපත්තියේ එවැනි කොන්දේසි පැහැදිලිව සඳහන් වන්නේ නම් පමණක්, කිසියම් අවසන් කරන ලද අයකුම සමාලෝචන ක්‍රියාවලියකට පෙර හෝ පසුව, බහු වාර්ෂික අයකුම යටතේ සාමාන්‍ය අයකුම ගොනු කිරීමක් ඉදිරිපත් කරන ලෙස බලපත්‍රලාභීන් සඳහා කොන්දේසි පැනවීමට නියාමකට හැක.

එ) බලපත්‍රලාභීන් සහ නියාමක විසින් කරන ලද සියලුම ගණනය කිරීම් සඳහා පූර්වයෙන් එකඟතාවට පත් ආකෘති සහ සැකැසුම් භාවිතා කළ යුතු අතර, ඕනෑම ගැළපුම් සිදු කිරීමක් ආකෘති මත පදනම්ව සිදු කළ යුතු අතර, එවැනි ගණනය කිරීම් ප්‍රකාශයට පත් කළ යුතුය. මෙම ගණනය කිරීම්වලට තොග සැපයුම් අයකුම ගණනය කිරීම, ගැලපුම් කළ තොග සැපයුම් අයකුම, පුරෝකථනය කරන ලද අවසන් පරිභෝජක පාරිභෝගික අයකුම, තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ඉතිරියෙහි පුරෝකථනය කරන ලද විචල්‍යයන්, උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සහ සැපයුම් අයකුම වල බහුවාර්ෂික අයකුම නිර්ණය සහ ප්‍රමාද වූ ප්‍රාග්ධන ආයෝජන නැවත අය කරගැනීම් යන එහෙත් ඒවාට පමණක් සීමා නොවන කරුණු ඇතුළත් වේ.

8. අවසන් පරිභෝජක පාරිභෝගික අයකුම සහ එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ අදාළ මෙහෙයුම් පරාමිතීන්, දකුණු සහ අග්නිදිග ආසියානු කලාපයේ තරඟකාරී ආර්ථිකයන්හි අයකුම සමඟ සංසන්දනය කොට පිල්-ලකුණු කිරීම සිදු කළ යුතුය.

8.1. කලාපයේ අනෙක් රටවල අයකුමවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අයකුම පිල්-ලකුණු කිරීම සිදු කළ යුතුය.

අ) සපයන ලද කි.වො. පැයකට සහ අනෙකුත් සුදුසු මූලික පදනම් මත පදනම්ව, උත්පාදන පිරිවැය, සම්ප්‍රේෂණයට අනුමත ආදායම, බෙදා හැරීම සහ සැපයුම් සේවා සඳහා අනුමත ආදායම අවම වශයෙන් කලාපයේ රටවල් 10 ක් සමඟ හෝ විදුලි උපයෝගිතා ආයතන සමඟ සංසන්දනය කිරීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම නියාමක විසින් සිදු කරනු ලැබිය යුතුය.

ආ) බහු වසර අයකුම කාල සීමාව ආරම්භයේදී, කලාපය තුළ ඇති සමාන සම්ප්‍රේෂණ උපයෝගිතා ආයතන සමඟ සම්ප්‍රේෂණ අයකුම පිල් ලකුණු කිරීම සිදු කර තවදුරටත් පිරිවැය අවම කිරීම සඳහා නිර්දේශද ඇතුලත්ව නියාමක විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශනයකින් ඉදිරිපත් කළ යුතුය.

ඇ) සමාන පාරිභෝගිකයින් සඳහා වන අවසන් පරිභෝජක පාරිභෝගික ගාස්තු, අවම වශයෙන් කලාපයේ රටවල් 10 ක් සමඟ හෝ විදුලි උපයෝගිතා ආයතන සමඟ සංසන්දනය කිරීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම නියාමක විසින් සිදු කරනු ලැබිය යුතුය.

8.2. විදුලි මිල ගණන් පිළිබඳ අනාගත දිශානතීන් විනිවිදභාවයෙන් යුතුව ප්‍රකාශයට පත් කළ යුතුය.

අ) උත්පාදන පුළුල් කිරීමේ සැලැස්මේ සහ සම්ප්‍රේෂණ පුළුල් කිරීමේ සැලැස්මේ සහ ඇස්තමේන්තුගත බෙදාහැරීම් පුළුල් කිරීමේ සැලසුම්වල සෑම සංශෝධනයකටම අනුකූල වන පරිදි නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සකස් කරන ලද සාමාන්‍ය පාරිභෝගික අයකුම සම්බන්ධයෙන් අවම වශයෙන් අවුරුදු 10ක පුරෝකථනයක් තිබිය යුතුය. එම පුරෝකථනයට දැනට සිදු කරගෙන යන කටයුතු සඳහා වන සියලු වියදම්, සහ ස්ථාවර සහ විචල්‍ය පිරිවැය ඇතුළුව ජාලයේ ඉදිරියට සැලසුම් කර ඇති වියදම් ඇතුළත් විය යුතුය.

ආ) නියාමක විසින්, පිල් ලකුණු අධ්‍යයනය සහ පුරෝකථන අයකුම මත පදනම්ව, අවසන් පරිභෝජක පාරිභෝගික අයකුම තරඟකාරී ඒවා බවට පත් කිරීමේ ක්‍රම සහ විධි පිළිබඳව බලශක්ති අමාත්‍යවරයා වෙත වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

9. බලපත්‍රලාභීන් ස්වයං අරමුදල් සපයාගන්නා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ලෙස ක්‍රියාත්මක වන ආයතන බව තහවුරු වන අයුරින් අයකුම ව්‍යුහය සකස් කිරීමට කටයුතු කළ යුතුය.

අ) ප්‍රතිපත්ති 1 සිට 8 දක්වා ලැයිස්තුගත කර ඇති උපාය මාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ රාමුව තුළින් මෙම ප්‍රතිපත්තිය සාක්ෂාත් කරගැනීමට කටයුතු කෙරෙනු ඇත.

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 4 (10) වගන්තිය ප්‍රකාරව පිළිගැනෙන පරිදි, බලශක්ති අමාත්‍යවරයා විසින්, මෙම ප්‍රතිපත්ති ලේඛනය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යුතුව ඊට අදාළව කරුණු දැක්වීම, සවිස්තරාත්මකව පැහැදිලි කිරීම හෝ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා කටයුතු කරනු ලැබිය හැකිය.

EOG 03 - 0064

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.